# වෘත්තීය සමිති

***වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීම සඳහා සම්පාදිත පනතකි***

## පටුන

I වෙනි කාණ්ඩය

***ප්‍රාරම්භය***


පිටුව

01.ලුහුඬු නාමය 7

02.පදර්ථය 7


II වෙනි කාණ්ඩය

***ලේකම් තැන සහ වෙනත් නිලධාරීන් පත් කිරීම***


03.ලේකම් තැන පත් කිරීම 10

04.උප ලේකම් වරුන් සහ වෙනත් නිලධාරීන් පත් කිරීම 10

05.සියලුම නිලධාරීන් ආන්ඩුවේ සේවකයන් සේ සැලකිය යුතු බව 10

06.ආන්ඩුවේ සේවකයන්ගේ ආරක්ෂාව 10


III වෙනි කාණ්ඩය

***ලියාපදිංචි කිරීම***


07.වෘත්තීය සමිති නාමලේඛණය 10

08.ලියාපදිංචි කිරීමට ඇති අවශ්‍යකත්වය 11

09.ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය 12

10.ලියාපදිංචි කිරීම 13

11.ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රය 13

12.වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ලේකම් තැනට ඇති බලය 13

13.නම වෙනස් කිරීමට ඉල්ලා සිටීමට ලේකම් තැනට ඇති බලය 14

14.ලියාපදිංචි කිරීමට බැරිය කීම 14

15.ලියාපදිංචි කිරීම අස් කර ගැනීම හෝ අවලංගු කිරීම 14

16.දිස්ත්‍රික් උසාවියකට ඇපැල් ගැනීම 16

17.ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැල් ගැනීම 18

18.ලියාපදිංචි කිරීමට නොහැකිවීමේ හෝ ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රකාශය අස්කර ගැනීමේ නැතහොත් අවලංගු කිරීමේ හෝ ප්‍රතිඵල 18


IV වෙනි කාණ්ඩය

***ආන්ඩුවේ සේවකයන්ගේ වෘත්තීය සමිති වලට අදාල වන විශේෂ විධිවිධාන***


19.මෙම කාණ්ඩය තේරුම් කර ගැනීම 19

20.ආණ්ඩුවේ සේවකයන්ගේ එක්තරා සමිති වර්ගයක් වෘත්තීය සමිති බව ප්‍රකාශ කිරීම.. 19

21.මෙම කාණ්ඩය අදාල වන සමිති ලියාපදිංචි කිරීම පිළිඹඳව සීමා කිරීම 20

22.මෙම කාණ්ඩය අදාල වන වෘත්තීය සමිතියක ලියාපදිංචි කිරීම අවලංගු කිරීම 22

23.මෙම පනතෙහි සමහර විධිවිධාන අදාල කිරීම අත් හැරීම 23

24.මෙම පනතෙහි වෙනත් විධිවිධාන ක්‍රියාවෙහි යෙදීම ඉතිරි කිරීම 23

V වෙනි කාණ්ඩය

***වෘත්තීය සමිති වල අයිතිවාසිකම් හා වගකීම්***


25.ලියාපදිංචි නොකරන ලද වෘත්තීය සමිති වලට බාධා 23
26.සමහර අවස්ථාවන්හි සිවිල් නඩු වලින් ලැබෙන විශේෂ මුක්ති 23
27.වෘත්තීය සමිතියක් සිවිල් වරදවලට වගකීමට බැඳී නැති බව 24
28.ගිවිසුම් පිළිඹදව වගකීම් 24
29.ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක කර්මාන්ත අවහිර කිරීමේ පරමාර්ථ තිබීම නීති විරෝධී නොවන බව 24
30.වෘත්තීය සමිතියක් විසින් නඩු පැවරීම සහ ඊට විරුද්දව නඩු පවරනු ලැබීම 24


VI වෙනි කාණ්ඩය

***ව්‍යවස්ථා***


31.බාල වයස්කාරයින්ගේ සාමාජිකත්වය 25
32.වෘත්තීය සමිතියක නිලධාරිහු 25
33.නම වෙනස් කිරීම 26
34.ඒකාබද්ධ කිරීම 26
35.නම වෙනස් කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ දැන්වීම 26
36.නම වෙනස් කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵල 29
37.ලියාපදිංචි කරන ලද කාරියාලය 29
38.ව්‍යවස්ථා 30
39.නිලධාරින් වෙනස් කිරීම ආදිය පිළිඹද දන්වීම 31
40.විසුරුවා හැරීමේ දැන්වීම 31
41.භාරකාරවරු 31


VII වෙනි කාණ්ඩය

***දේපල***


42.සියලුම දේපල වල අයිතිය භාරකාරවරුන් මත පැවරෙන බව 31
43.දේපල අයිති වීම 32
44.ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීම හෝ බදු ගැනීම 32


VIII වෙනි කාණ්ඩය

***අරමුදල් සහ ගණන්***


45.අරමුදල් යෙදීම 32
46.සමිතියක අරමුදල් නොයෙදිය යුතු කාර්යය 32
47.දේශපාලන පරමාර්ථ සහ දේශපාලන අරමුදල 32
48.බලය නොලත් හෝ නීති විරෝධී වියදම් වැළැක්වීමේ තහනම 36
49.භාණ්ඩාගාරික තැන ගනුදෙනු ඉදිරිපත් කල යුතු බව 36
50.වාර්ෂික වාර්ථා 37
51.ගණන් පරීක්ෂා කර බැලීම සහ ලේඛන 38


IX වෙනි කාණ්ඩය

***නියෝග***


52.නියෝග 39
53.නියෝග අනුමත කිරීම 40

X වෙනි කාණ්ඩය

***වැරදි සහ දඬුවම්***


54.ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක මුදල් හෝ දේපල වැරදි ලෙස පාවිච්චි කිරීම ගැන දඬුවම 40
55.වෘත්තීය සමිති සම්බන්ධව අසත්‍ය තොරතුරු සැපයීම 41
56.මෙම පනතෙහි වාර්තා ආදිය සම්බන්ධයෙන් වූ විධිවිධාන පිළි නොපැදීම ගැන දඬුවම 42
57.සාමාන්‍ය දඬුවම 42
58.නඩු පැවරීම සීමා කිරීම 43
59.වෙනත් ලිපිගත නීතියක් යටතේ වූ වැරදි අත්හැරීම 43


XI වෙනි කාණ්ඩය
***විවිධ කරුණු***


60.සමහර ගිවිසුම්වලට පනතින් හානියක් නෙවන බව 43
61.සමහර පනත් වෘත්තීය සමිති වලට අදාල නොවන බව 43
62.නීත්‍යානුකල කැඳවීම් නියෝග ආදිය භාර කරවීම 44

**පළමුවන උපලේඛනය** 44
**දෙවන උපලේඛනය** 45

# වෘත්තීය සමිති

***වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීම සඳහා සම්පාදිත ආඥාපනතකි***

I වෙනි කාණ්ඩය

**ප්‍රාරම්භය**

**ලුහුඬු නාමය** 1.මෙම පනත වෘත්තීය සමිති ආඥාපනත යයි හැඳින්විය හැකිය

**පදාර්ථය** 2.මෙම ආඥාපනතෙහි පද යෙදුමෙන් වෙනස් අර්ථයක් ඇතිවුවහොත් මිස පහත සඳහන් පාඨවල අර්ථය පහත පෙනෙන පරිදි වන්නේය.

'විධායක මණ්ඩලය' යනුවෙන් එය කෙබඳු නමකින් හඳුන්වනු ලැබුවත් වෘත්තීය සමිතියක කටයුතු භාර කරන ලද මණ්ඩලයක් අදහස් කරයි . වෘත්තීය සමිතියක සභාපතිද ලේකම් සහ භාණ්ඩාගාරිකද ඊට ඇතුලත් වන්නෝය.

'දෙරවැස්මක් ' යනුවෙන් වැඩදෙන ස්ථානයක් වැසීම හෝ වැඩ තාවකාලිකව නැවැත්වීම හෝ සේවය කරන ලද කීප දෙනෙක ආරවුලක් නිසා සේවයට ගැනීමට සේවා යෝජකයා බැරි යයි කීම හෝ අදහස් කෙරෙයි.එසේ බැරියයි කියන්නේ සේවයෙහි හෝ සේවය සම්බන්ධවූ හෝ නියමයන් භාර ගැනීමට ඔවුන්ට බල කරනු සඳහා විය යුතුය.නැතහොත් වෙනත් සේවායෝජකයෙකුට ඔහුගේ සේවයෙහි යෙදී සිටින්නවුන්ට එබඳු නියමයන් භාර ගැනීමට බලකරවීම ට උපකාර කරනු සඳහා විය යුතුය.

'නිලධාරියා' යන්නට වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් යොදන කල්හි එහි විධායක මණ්ඩලයෙහි සාමාජිකයෙක් ඇතුලත වෙයි. එහෙත් ගණන පරීක්ෂකයෙකු ඇතුලත් නැත.

' නියමිත ' යන්නට මෙම පනතෙහි 46 වෙනි වගන්තිය යටතේ සාදන ලද නියෝගයන්ගෙන් නියමිත බවක් අදහස් කෙරෙයි.

නාම ලේඛනය ' යන්නෙන් 7 වෙනි වගන්තිය යටතේ ලේකම් තැන විසින් තබනු ලබන නාම ලේඛනය අදහස් කෙරෙයි.

'ලියාපදිංචි කරන ලද කාර්යාලය' යනුවෙන් වෘත්තීය සමිතියේ ප්‍රධාන කාර්යාලය වශයෙන් ලියාපදිංචි කරන ලද සමිතියේ කාර්යාලය අදහස් කෙරෙයි.

'ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතිය' යනුවෙන් මෙම පනත යටතේ ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක් අදහස් කෙරෙයි.

' ලේකම්' යන්නෙන් 3 වෙනි වගන්තිය යටතේ ආණ්ඩුකාරතුමා විසින් වෘත්තීය සමිති ලේකම් හැටියට හෝ වැඩ බැලීමට හෝ එවකට පත් කරනු ලබන තැනැත්තා අදහස් කෙරෙයි.4 වෙනි වගන්තිය යටතේ ආණ්ඩුකාරතුමා විසින් වෘත්තීය සමිති උපලේකම් තැන හැටියට හෝ වැඩ බැලීමට හෝ පත් කරන ලද තැනැත්තාද එයට ඇතුලත් වෙයි.

' නියෝගය ' යනු ඇමතිවරයා විසින් පනවන ලද නියෝගයයි.

'වැඩ නැවැත්වීම' යන්නෙන් යම්කිසි වයාපාරයක හෝ කර්මාන්තයක සේවයෙහි යෙදී සිටින අයවලුන් සමූහයක් එක්ව වැඩ නතර කිරීමක් හෝ එක්සිත්ව වැඩ කිරීම පිණිස වැඩ භාර ගැනීමට බැරි යයි කීමක් හෝ එවකට සේවයෙහි යෙදී සිටින නැතහොත් කලින් සේවයෙහි යෙදුන අයවලුන් කීපදෙනෙකු එකම අදහස පිට එසේ වැඩ කිරීමට හෝ වැඩ භාර ගැනීමට බැරි යයි කීමක් හෝ අදහස් කෙරෙයි.

' කර්මාන්ත ආරවුල ' යන්නෙන් යම්කිසි අයෙකු සේවයට ගැනීම හෝ සේවයට නොගැනීම සම්බන්ධව හෝ සේවා නියම හෝ කාර්මික තත්ත්ව පිළිබඳව හෝ සේවා යෝජකයන් සහ කම්කරුවන් අතර හෝ කම්කරුවන් සහ කම්කරුවන් අතර හෝ ඇතිවන යම්කිසි ආරවුලක් හෝ භේදයක් අදහස් කෙරෙයි.

'වෘත්තීය සමිතියක්' යනුවෙන් පහත දැක්වෙන පරමාර්ථවලින් එකක් හෝ වැඩි ගණනක් ඇතිව

තාවකාලිකව හෝ ස්ථිර කම්කරුවන්ගේ හෝ සේවා යෝජකයන්ගේ සමිතියක් හෝ ඒකාබද්ධ වීමක් අදහස් කෙරෙයි.එම පරමාර්ථ නම් -

අ) කම්කරුවන් හා සේවායෝජකයන් අතර හෝ කම්කරුවන් හා කම්කරුවන් අතර හෝ සේවායෝජකයන් හෝ සේවායෝජකයන් අතර හෝ ඇති සම්බන්ධතා විධිමත් කිරීම

ආ) කාර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් ගෙන යාම පිළිබඳව එයට සීමා කිරීමේ නියමයන් පැනවීම.

ඉ) කාර්මික ආරවුල් වලදී කම්කරුවන් හෝ සේවා යෝජකයන් වෙනුවෙන් නියෝජනය කිරීම හෝ

ඊ) යම්කිසි ව්‍යාපාරයක හෝ කර්මාන්තයක ඇති වන වැඩ නැවැත්වීම් වලට හෝ දොර වැසුම් වලට

ආධාර කිරීම හෝ වැඩ නැවැත්වීමක් හෝ දොරවැසීමක් පවත්නා කාලයේදී එහි සාමාජිකයින්ගේ පඩිය හෝ වෙනත් සහන සම්බන්ධයෙන් ආධාර කිරීම හෝ සංවිධාන කිරීමද වේ.

තවද වෘත්තීය සමිතියකට වෘත්තීය සමිති දෙකකින් හෝ එයට වැඩි ගණනකින් යුක්ත වූ ංංවිධානයක්ද ඇතුළත් වෙයි.

' 'කම්කරුවා' යන්නට සේවායෝජකයෙකු සමග ගිවිසුමකට බැඳුණු හෝ ගිවිසුමක් යටතේ කොයි ආකාරයකට වුවද වැඩ කරන හෝ අයෙක් ඇතුලත් වෙයි.එම ගිවිසුම ප්‍රකාශිත හෝ වටහා ගත හැකි ලේඛිත වූවක් හෝ වාචික වූවක් විය හැකිය.සේවය පිළිබඳව හෝ පුහුණුවීම් පිළිබඳව හෝ යම්කිසි වැඩක් තමන්ම කර දීමට පොරොන්දු වන හෝ ගිවිසුමක් විය හැකිය.තවද එබඳු ගිවිසුමක් යටතේ සාමාන්‍යයෙන් සේවයට බඳවා ගත් එක්තරා විශේෂ අවස්ථාවක සේවයෙහි සිටි හෝ නොසටි කෙනෙක්ද ඇතුලත් වෙයි.

## II වෙනි කාණ්ඩය

## *ලේකම් තැන සහ වෙනත් නිලධාරීන් පත් කිරීම*

*ලේකම් තැන පත් කිරීම*

3.මෙම පනත යටතේ ලේකම් තැන වශයෙන් පැවරෙන කාර්යය කිරීම පිණිස ද යුතුකම් ඉෂ්ඨ කිරීම පිනිසද වගකිවයුතු වෘත්තීය සමිති ලේකම් කෙනෙකු පත් කළ හැකිය.

*උප ලේකම් වරුන් සහ වෙනත් නිලධාරීන් පත් කිරීම*

4.මෙම පනත යටතෙහි කාර්ය සඳහා උපලේකම්වරුන් එක්කෙනෙකු හෝ ඊට වැඩි ගණනක්ද කලින් කල වුවමනා වන පරිදි වෙනත් නිලධාරීන්ද පත්කර ගත හැකිය.

*සියලුම නිලධාරීන් ආන්ඩුවේ සේවක යන් සේ සැලකිය යුතු බව*

5.මෙම පනතෙහි 3 වෙනි හා 4 වෙනි වගන්ති යටතේ පත්කර ගන්නා ලද නිලධාරීන් දණ්ඩ නීතියෙහි අර්ථය අනුවම ආණ්ඩුවේ සේවකයන් හැටියට සැලකිය යුතුය.

*ආන්ඩුවේ සේවක යන්ගේ ආරක්ෂාව*

6.මෙම පනත යටතේ ක්‍රියා කිරීමේදී හොඳ අදහසින කරන ලද හෝ කරන්නට නොහැකි වුන හෝ දෙයක් ගැන ආණ්ඩුවේ සේවකයෙකුට විරුද්ධව නඩු පැවරිය නොහැකිය.

## III වෙනි කාණ්ඩය

## *ලියාපදිංචි කිරීම*

*වෘත්තීය සමිති නාම ලේඛණය*

7. (1) ලේකම් තැන විසින් ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වූ නියමිත විස්තරද නමෙහි හෝ ව්‍යවස්ථාවල හෝ නිලධාරීන්ගේ හෝ විධායක මණ්ඩලයෙහි හෝ ලියාපදිංචි කරන ලද කාර්යාලයෙහි හෝ කලින් කල කරනු ලබන වෙනස් වීම්ද මෙම පනත යටතේ ලියාපදිංචි කිරීමට වුවමනා වූ වෙනත් සියළු කරුණුද ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති නාම ලේඛනයක් නියමිත ආකෘතියකට අනුව ලේකම් තැන විසින් තැබිය යුතුය.

(2)එම නාම ලේඛණයෙහි සටහනක සහතික පිටපතක් එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් එම පිටපතෙහි සඳහන් දිනයෙහිද සිද්ධ වූ බවට තීරණාත්මක සාක්ෂියක් වන්නේය.

*ලියාපදිංචි කිරීමට ඇති අවශ්‍යකත්වය*

8. (1) මෙම පනත ක්‍රියාවෙහි යොදවන ලද දිනයට පෙර පිහිටුවන ලද සෑම වෘත්තීය සමිතියක්ම එම දින සිට තුන් මාසයක් ඇතුලතදී මෙම පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට ඉල්ලා සිටිය යුතුය.

(2) මෙම පනත ක්‍රියාවෙහි යෙදවීමෙන් පසු පිහිටුවන ලද සෑම වෘත්තීය සමිතියක්ම එය පිහිටුවන ලද දිනයේ සිට තුන් මාසයක් ඇතුලතදී මෙම පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට ඉල්ලා සිටිය යුතුය.

(3) (1) වෙනි සහ (2) වෙනි උප වගන්ති වල සඳහන් කාලසීමාවන් ලේකම් තැනට සුදුසු යැයි හැගෙතොත් කලින් කල දීර්ඝ කළ හැකිය.

එසේ ද වුවත් කොයි යම් අවස්ථාවකදී වුවද එබදු කාලයක් දීර්ඝ කිරීමෙන් පසුව මුලු කාලය හය මාසයකට වඩා වැඩිවන සේ දීර්ඝ නොකල යුතුය.

4) (2) වෙනි වගන්තියේ වෘත්තීය සමිතියක් විස්තර කිරීමේදී දැක්වූ පරමාර්ථයන්ගෙන් එකක් හෝ වැඩිගණනක් සඳහා සමිතියක් හෝ සමිති සංගමයක් ඇති කිරීමට කම්කරුවන් සමූහයක් හෝ සේවායෝජකයන් සමූහයක් ගිවිසගත් පළමුවෙනි දිනය මෙම පනතෙහි කාර්යයන් සඳහා වෘත්තීය සමිතිය පිහිටවූ දිනය වන්නේය.

5) මෙම වගන්තියේ විධිවිධාන ප්‍රකාර ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කිරීම පැහැර හරින යම්කිසි වෘත්තීය සමිතියකට විරුද්ධව නඩු පැවරීමේදී (5) වෙනි උප වගන්තියෙහි දැක්වෙන දිනය පිළිබඳ සාක්ෂි නොමැති විටක එම වෘත්තීය සමිතිය පිහිටුවන ලද දිනය පහත දැක්වෙන පරිදි සැලකිය යුතුවේ.

අ) එම වෘත්තීය සමිතියෙහි සාමාජිකයෙකු වශයෙන් යමෙකු ඇතුළත් කරන ලද බවට හෝ පිළිගන්නා ලද බවට ඔප්පුවූ දිනය නැතහොත්

ආ) 2 වෙනි උප වගන්තියෙහි වෘත්තීය සමිතියක් විස්තර කිරීමේදී දැක්වූ පරමාර්ථ වලින් එකක් හෝ එයට වැඩිගණනක් සඳහා යම් ක්‍රියාවක් යමෙකු විසින් කරන ලදැයි ඔප්පු වූ දිනය වේ.

තවද අ) සහ ආ) ඡේදවල දැක්වෙන දින දෙකම ඔප්පු කිරීමට සාක්ෂි ඇති අවස්ථාවක ඉන් කලින් වූ දිනය එම වෘත්තීය සමිතිය පිහිටුවන ලදදිනය වශයෙන් සැලකිය යුතුය.

*ලියාපදිංචි කිරීමේඉල්ලුම් පත්‍රය*

9. (1) වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘතියක ලේකම් තැන වෙත යැවිය යුතුය.තවද එය යටත් පිරිසෙයින් සමිතියේ සාමාජිකයන් සත් දෙනෙකු විසින් අත්සන් කල යුතුය. ඉන් කිසිවෙකු සමිතියේ නිලධාරියෙක්ද විය හැකිය.

(2)එබදු සෑම ඉල්ලුම් පත්‍රයකම රුපියලක වටිනාකමැති මුද්දරයක් ඇලවිය යුතුය.තවදප් සමගම එම වෘත්තීය සමිතියෙහි ව්‍යවස්ථා ද පහත දැක්වෙන විස්තර සඳහන් ලේඛනයක්ද යැවිය යුතුය.

(අ) ඉල්ලීම කරන සාමාජිකයන්ගේ නම් රක්ෂාවල් සහ ලියුම් ලැබෙන පිළිවෙල

(ආ)වෘත්තීය සමිතියෙහි නම සහ එහි ප්‍රධාන කාර්යාලය

(ඉ)වෘත්තීය සමිතියේ නිලධාරීන්ගේ පදවි නාම නම් වයස ලියුම් ලැබෙන පිළිවෙල සහ රක්ෂාවල්ද වේ.

(3) මෙම පනත ක්‍රියාවෙහි යෙදවීමට පළමු පිහිටුවන ලද වෘත්තීය සමිතියක් විසින් එම සමිතිය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ඉලලුම් පත්‍රයක් සමග නියමිත ආකෘතියක නියම කරන ලද විස්තර ඇතුළත් කොට සැපයුතු එම වෘත්තීය සමිතියේ වත්කම් හා ණය සාමාන්‍ය සටහනක්ද ලේකම් තැන වෙත භාරදිය යුතුය.

*ලියාපදිංචි කිරීම*

10.ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන යම් වෘත්තීය සමිතියක් මෙම පනතෙහි විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝග වල එකග බවද එහි ව්‍යවස්ථා සමූහය ඉහත කී විධිවිධාන වලට විරුද්ධ නොවන බව සහ නීති විරෝධී නොවන බවද ලේකම් තැනට සෑහෙන ලෙස ඒත්තු ගියොත් එම සමිතිය ඔහු විසින් නියමිත ප්‍රකාරයට ලියාපදිංචි කල යුතුය.

එසේද වුවත් එම වෘත්තීය සමිතියෙහි පරමාර්ථ වලින් එකක් වුවද නීති විරෝධී නම් එම ලියාපදිංචි කිරීම නිෂ්ප්‍රභා වන්නේය.

*ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රය*

11.10 වෙනි වගන්තිය යටතේ වෘත්තීය සමිතියක් ලියාපදිංචි කරන ලේකම්තැන වසින් නියමිත ආකෘතියක ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රකාශයක් එම වෘත්තීය සමිතිය වෙත නිකුත් කල යුතුය. එම සහතික ප්‍රකාශය අවලංගු කල බව හෝ අස් කර ගත් බව ඔප්පු කරන තෙක් එය එම සමිතිය මෙම පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කළ බවට සෑම කාරියක් සඳහාම තීරණාත්මක සාක්ෂියක් වන්නේය.

*වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ලේකම් තැනට ඇති බලය*

12. යම්කිසි ඉල්ලීමක් 9 වෙනි වගන්තියේ විධිවිධාන වලට එකගදැයි හෝ එහි සඳහන් වෘත්තිය සමිතිය මේ පනත යටතේ ලියාපදිංචි කල යුතු දැයි හෝ තමාටම සෑහෙන පරිදි වටහා ගැනීම පිණිස වැඩිදුර තොරතුරු ඉල්ලා සිටීමට ලේකම් තැනට පිළිවෙන.

**නමවෙනස් කිරීමට ඉල්ලා සිටීමට ලේකම් තැනට ඇති බලය**

13.ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන වෘත්තිය සමිතියක නම එවකට පවත්නා ලියාපදිචි කරන ලද වෙනත් වෘත්තිය සමිතියක නම හා සමාන නම් නැතහොත් ලේකම් තැනගේ අදහස පරිදි එහි කෙතරම් කිට්ටු සමානකමක් තිබේද යත හොත් මහජනයා හෝ එම සමිතිවල සබිකයන් හෝ රවටනසුලු නම් නැතහොත් නොමග යවන සුලු නම් ඉල්ලුම්පත්‍රයෙහි දැක්වෙන වෘත්තිය සමිතියෙහි නම් වෙනස් කරන ලෙස එසේ ලියාපදිංචි කිරීමට ඉල්ලන අයට ලේකම් තැන විසින් දැන්විය යුතුය. එසේ නම වෙනස් කරන තෙක් ලේකම්තැන විසින්, එම වෘත්තිය සමිතිය ලියාපදිංචි කිරීම ප්රyතික්ෂේ කළ යුතුය.

**ලියාපදිංචි කිරීමට බැරිය කීම**

14.යම්කිසි වෘත්තිය සමිතියක් මෙම පනතෙහි විධිවිධාන වලට හෝ එය යටතේ සාදන ලද නියෝග වලට හෝ එකග නොවන බව නැතහොත් එහි පරමාර්ථ වලින් හෝ ව්‍යවස්ථා වලින් එකක් නමුදු නීති විරෝධි බව නැතහොත් සමිතියෙහි ව්‍යවස්ථා පද්ධතිය නීති විරෝධි බව ලේකම් තැනට සෑහෙන ලෙස ඒත්තු ගියොත් එම සමිතිය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට ඔහුට පිළිවන.

15. (1) වෘත්තිය සමිතියක් ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රකාශය අස් කර ගැනීමට හෝ අවලංගු කිරීමට පහත දැක්වෙන අවස්ථා වල ලේකම් තැනට පිළිවන.

(අ) ලේකම් තැනට වුවමනා වන පරිදි පරීක්ෂා කර බැලම පිණිස වෘත්තිය සමිතියක් විසුරුවා හැරීමේ
හිදි එම වෘත්තිය සමිතියේ ඉල්ලීම පිට, සහ

(ආ)පහත සඳහන් අවස්ථාවක් ඇතිවී යයි ලේකම් තැනට ඒත්තු ගිය විට ද වේ.
එනම්...

**ලියාපදිංචි කිරීම අස් කර ගැනීම හෝ අවලංගු කිරීම**

i)ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රකාශය වංචාවෙන් හෝ වැරදීමකින් ලබා ගැනීම.

(ii)වෘත්තිය සමිතියෙහි පරමාර්ථයන්ගෙන් හෝ ව්‍යවස්ථාවලින් හෝ යම් කිසිවක් නීතිවිරෝධිව තිබීම.

(iii)වෘත්තිය සමිතියෙහි ව්‍යවස්ථා පද්ධතිය හෝ එහි විධායක මණ්ඩලය නීති විරෝධි වීම.

(iv)වෘත්තිය සමිතියක් ඕනෑකමින් ම සහ ලේකම් තැනගේ දැන්වීමෙන් පසුවද මෙම පනතෙහි යම්කිසි විධිවිධානයක් කඩ කිරීම හෝ එබදු විධිවිධානයකට විරුද්ධව යම්කිසි ව්‍යවස්ථාවක් බලපැවැත්වීමට ඉඩ හැර තිබීම නැතහොත් 32 වෙනි වගන්තිය ප්‍රකාර විධිවිධාන සැලකිය යුත යම් කිසි කරුණක් සම්බන්ධයෙන් වූ ව්‍යවස්ථාවක් අවලංගු කොට තිබීම.

(v) වෘත්තිය සමිතියෙහි අරමුදල් නීතිවිරෝධි ලෙස හෝ නීතිවිරෝධි පරමාර්ථයන් සඳහා හෝ සමිතියේ ව්‍යවස්ථාවන්ගෙන් බලය නොලබන ලද පරමාර්ථයක් සඳහා හෝ වියදම් කොට තිබීම සහ

(vi) වෘත්තිය සමිතිය අභාවයට ගොස් තිබීමද වේ.

(2) (1) වෙනි උප වගන්තියෙහි (අ) ඡේදයෙහි සඳහන් අවස්ථා වල හැර වෘත්තිය සමිතියක ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රකාශයක් අස් කර ගැනීමට හෝ අවලංගු කිරීමට මාස 2කට අඩු නොවන කාලයකට ප්‍රථම එසේ අවලංගු කිරීමට නැතහොත් අස්කර ගැනීමට හේතුවූ කරුණුද සඳහන් කොට එකී වෘත්තිය සමිතියට ලේකම් තැන විසින් ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

(3) (2) වෙනි උපවගන්තිය යටතේ දැන්වීමක් භාර කරන වෘත්තිය සමිතියකට එම දැන්වීමෙහි දිනය සිට මාස දෙකක කාලය ඇතුලතදී ඕනෑම දවසක එසේ එම වෘත්තිය සමිතියෙහි සහතික ප්‍රකාශය අස් කර ගැනීමේ හෝ අවලංගු කිරීමේ අදහසට විරුද්ධව ලියවිල්ලකින් කරුණු පෙන්වීමට පිළිවන.එසේ කරුනු පෙන්වූ විට අවස්ථාවට අවශ්‍ය යැයි හැගෙන විභාගයක් ලේකම් තැනට පැවැත්විය හැකිය.

(4) (3) වෙනි උප වගන්තියේ සඳහන් මාස 2ක කාලය ඉකුත් වීමෙන් පසු එම උපවගන්තිය යටතේ යම්කිසි වෘත්තිය සමිතියක් විසින් කරුනු නොපෙන්වූ විටද නැතහොත් පෙන්වන ලද කරුණු සහතික ප්‍රකාශය අස් කර නොගැනීමට හෝ අවලංගු නොකිරීමට ප්‍රමාණවත් යැයි ලේකම් තැන විසින් නොපිළිගත් විටද එම වෘත්තිය සමිතිය ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රකාශය අස් කර ගැනීමට හෝ අවලංගු කිරීමට ලේකම් තැනට පිළිවෙන.

(5) යම්කිසි වෘත්තිය සමිතියක ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රකාශය අස් කර ගනිමින් හෝ අවලංගු කරමින් ලේකම් තැන විසින් මේ පනත යටතේ කරන ලද ආඥාවෙහි දිනය ආඥාව කර ලද දිනයම විය

යුතුයි.තවද එම ආඥාව එහි සඳහන් වෘත්තීය සමිතිය වෙත වහා භාර කරවිය යුතුය.

**දිස්ත්‍රික් උසාවියකට ඇපැල් ගැනීම**

16. (1) ලේකම් තැන විසින් වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා හෝ 15 වෙනි වගන්තිය යටතේ ඔහු විසින් කරන ලද ආඥාවක් නිසා හෝ අතෘප්ත වූ යමෙකුට එබඳු ප්‍රතික්ෂේප කිරීමකට හෝ ආඥාවකට හෝ විරුද්ධව එසේ ප්‍රතික්ෂේප කිරීමේ හෝ එම ආඥාවේ හෝ දින සිට තිස් දවසක කාලයක් ඇතුළතදී දිස්ත්‍රික් උසාවියකට ඇපැල් පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් ඇපැල් ගැනීමට පිළිවන.

(2) (1) වෙනි උපවගන්තිය යටතේ වූ සෑම ඇපැල් පෙත්සමක්ම පහත දැක්වෙන කරුණු වලින් සමන්විත විය යුතුය.

අ) ලේකම් තැන වගඋත්තරකරු වශයෙන් නම් කිරීම.
ආ) ඇපැල් ගැනීම සඳහා හේතු ලෙස පෙන්වන කරුණුද ඇපැල් ගැනීමට හේතුවූ ප්‍රතික්ෂේප කිරීම හෝ ආඥාව කළ දිනයද සඳහන් කිරීම.
ඇ) ඇපැල්කරු විසින් අත්සන් කිරීම ; හා
ඈ) රුපියලක මුද්දරයක් ඇලවීමද වේ.

(3) ඇපෑලේදී පහත දැක්වෙන යමක් කිරීමට දිස්ත්‍රික් උසාවියට බලය තිබේ

(අ) වැඩිදුර විස්තර සැපයීමට ඇපැල්කරුට හෝ ලේකම් තැනට නියම කිරීම.

(ආ) විභාගයක් පවත්වා ඔහුට අවශ්‍ය යැය හැගෙන සාක්ෂි අසා සටහන් කර ගැනීම.

(ඇ) ඇපෑලට ඉඩ හරිමින් වෘත්තීය සමිතිය ලියාපදිංචි කිරීමට නියම කිරීමට හෝ 15 වෙනි වගන්තිය යටතේ ලේකම් තැන විසින් කරන ලද යම්කිසි ආඥාවක් වෙනස් කිරීම.

(ඈ) ඇපෑල නිෂ්ප්‍රභා කිරීම හෝ සාධාරණයයි කල්පනා කරන ආඥාවක් කිරීම ; හා

(ඉ) ඇපෑලේ ගාස්තුද ඇපෑල ඇසීමේදී අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටියද ඇතුළුව සාධාරණ ලෙස පෙනි යන ආඥාවක් හා අවශ්‍ය යයි හැගෙන වෙනත් නියමත් කිරීමද වේ.

(4) මෙම වගන්තියෙහි වෙන ආකාරයකට නියම කරන ලද අවස්ථාවල හැර වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරමින් ලේකම් තැන විසින් කරන ලද ආඥාවකට විරුද්ධව හෝ 15 වෙනි වගන්තිය යටතේ ලේකම් තැන විසින් කරන ලද ආඥාවකට විරුද්ධව හෝ දිස්ත්‍රික් උසාවියකට ඉදිරිපත් කරනු ලබන ඇපෑලක් මුද්දර පනතෙහි හා සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි කාර්යයන් සඳහා රුපියල් 300ක වටිනාකමැති නඩුවක් මෙන් සලකනු ලැබේ.

(5) මෙම වගන්තියෙහි වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීමට ලේකම් තැනගේ ප්‍රතික්ෂේප කිරීමකට විරුද්ධව කරන ලද ඇපෑලක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් උසාවිය යන්නෙන් අදහස් කරන්නේ 9 වෙනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට ඉල්ලා සිටින වෘත්තීය සමිතියෙහි ප්‍රධාන කාර්යාලය පිහිටි ප්‍රදේශයෙහි අධිකරණ බලය හිමි දිස්ත්‍රික් උසාවියයි. 15 වෙනි වගන්තිය යටතේ ලේකම් තැන විසින් කරන ලද ආඥාවකට විරුද්ධව ගන්නා ලද ඇපෑලක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් උසාවියක් යන්නෙන් අදහස් කරන්නේ එම ආඥාව අදාල වූ වෘත්තීය සමිතියෙහි ප්‍රධාන කාර්යාලය පිහිටි ප්‍රදේශයෙහි අධිකරණ බලය හිමි දිස්ත්‍රික් උසාවියයි.

**ශ්‍රේෂ්ඨාධිකරණයටඇපැල් ගැනීම**

17. 16 වෙනි වගන්තිය යටතේ දිස්ත්‍රික් උසාවියක් විසින් කරන ලද ආඥාවකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැල් ගැනීමට බලය තිබේ. එබඳු ඇපෑලකට සම්බන්ධය ඇති සියලු කරුණු වලදී සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි යථා පරිදි අදාල වන්නේය.

***ලියාපදිංචි කිරීමට නොහැකිවීමේ හෝ ලියාපදිංචි කිරීමේ සහතික ප්‍රකාශය අස්කර ගැනීමේ නැතහොත් අවලංගු කිරීමේ හෝ ප්‍රතිඵල***

18. යම්කිසි වෘත්තීය සමිතියක් නියමිත කාලය තුළදී ලියාපදිංචි කිරීමට ඉල්ලුම් නොකළ විට හෝ ඉල්ලුම් කරන ලදුව ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබූ විට හෝ සහතික ප්‍රකාශය අස් කරනු ලැබූ විට නැතහොත් අවලංගු කරනු ලැබූ විට හෝ පහත සඳහන් ප්‍රතිඵල ඇතිවන්නේය.

(අ)එම වෘත්තීය සමිතිය නීති විරෝධී සමිතියක් ලෙස සලකනු ලබනවත් හැර ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියකට හිමි අයිතිවාසිකම් හෝ විශේෂ මුක්ති හෝ විශේෂ බල කිසිවක් භුක්ති විඳීමට නුපුළුවන. එහෙත් සමිතියට සහ එහි වත්කම් විරුද්ධව බල පැවැත්විය හැකි කලින් වූ හෝ මතුවට විය හැකි යම්කිසි ණය ගනුදෙනු ආදියක් පිළිබඳව ඉන් හානියක් නොවන්නේය.

(ආ)එම වෘත්තීය සමිතිය හෝ එහි නිලධාරින්ගෙන් කිසිවෙකු හෝ එය වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයෙකු හෝ යම්කිසි කාර්මික ආරවුලකට සහභාගී නොවිය යුතුය. එසේම යම්කිසි වැඩ නැවැත්වීමක් නැතහොත් දොරවැස්මක් ඇති කිරීම සංවිධාන කිරීම හෝ එවැන්නකට මුදල් යෙදීම නැතහොත් එබඳු වැඩ නැවැත්වීමක් හෝ දොරවැස්මක් පවත්නා කාලය තුළ එහි සාමාජිකයන්ට මුදල්

ගෙවීම හෝ වෙනත් සහන සැලසීම නොකළ යුතුය.

(ඈ)එම වෘත්තිය සමිතිය විසුරුවා හැරිය යුතුවත් හැර එහි අරමුදල් එම වෘත්තිය සමිතියෙහි ව්‍යවස්ථා ප්‍රකාර යෙදවිය යුතුය.

(ඈ)එම වෘත්තිය සමිතියට විරුද්ධව ඇතිවන විභාගයකදී එම සමිතිය වෙනුවෙන් උත්තර කිම හෝ සමිතිය විසුරුවා හැරීම හෝ ව්‍යවස්ථා ප්‍රකාර අරමුදල් යෙදවීම හෝ යන කෘත්‍යයන් සඳහා මිස එය පාලනය කිරීම හෝ සංවිධානය කිරීම සඳහා සහභාගි වීම නැතහොත් සමිතිය වෙනුවෙන් හෝ එහි නිලධාරියෙකු වෙනුවෙන් හෝ යමක් කිරීම හෝ යමක් කරන්නාක් මෙන් ඇඟවීම හෝ කිසිවෙකු විසින් නොකල යුතුය.

IV වෙනි කාණ්ඩය

***ආන්ඩුවේ සේවකයන්ගේ වෘත්තිය සමිති වලට අදාල වන විශේෂ විධිවිධාන***

**මෙම කාණ්ඩය තේරුම් කර ගැනීම**

19.මෙම කාණ්ඩයෙහි,

(අ) ආණ්ඩුවේ සේවකයා යන්නට සේව නියම හෝ සේවා කාලය හෝ කෙසේ වුවද ලංකාණ්ඩුවේ සේවයෙහි නියුක්ත කවරෙකු වුවද ඇතුලත්ය.

(ආ) මෙම කාණ්ඩය අදාල වන වෘත්තිය සමිතිය යනුවෙන් ආණුඩුවේ සේවකයන් සාමාජිකයන් වන නැතහොත් සමිතියෙ සාමාජිකත්වය ව්‍යවස්ථානුකුලව ආණ්ඩුවේ සේවකයන්ට ඉඩ හැර තිබෙන ඕනෑම වෘත්තිය සමිතියක් අදහස් කරයි.

**ආණ්ඩුවේ සේවකයන්ගේ එක්තරාසමිති වර්ගයක් වෘත්තිය සමිති බව ප්‍රකාශ කිරීම.**

20. (1) වෙනි උපවගන්තියෙන් නියම කරන ලද අවස්ථාවන් හැර 2 වෙනි වගන්තියේ වෘත්තිය සමිතිය විස්තර කිරීමේදී සඳහන් පරමාර්ථයන් එකක් හෝ වැඩි ගණනක් පරමාර්ථ කොට ඇති ආණ්ඩුවේ සේවකයන්ගේ සෑම සමිතියක් හෝ එක්වීමක් මේ පනතේ කාර්යයන් සඳහා වෘත්තිය සමිතියක් බව සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. මෙම පනතෙහි විධිවිධාන මෙම කාණ්ඩයෙහි ඉදිරියට ඇති විධිවිධානයන්ට යටත්ව එබඳු සෑම සමිතියකට හෝ එක්වීමකට යථා පරදි අදාල වන්නේය.

(2) (අ) අධිකරණ නිලධරයන්ගෙන්

(ආ) සන්නද්ධ හමුදාවල සාමාජිකයන්ගෙන්

(ඇ) පොලිස් නිලධරයන්ගෙන

(ඈ) බන්ධනාගාර නිලධාරීන් හෝ ගොවිකම් හමුදා ආඥා පනත යටතේ පිහිටුවනු ලැබූ යම් හමුදාවක සාමාජිකයන්ගෙන්

සමන්විත සංගමයක් හෝ සංයුක්තයක් එහි පරමාර්ථවල සඳහන් කිසිවක් නොතකා වෘත්තිය සමිතියක් නොවන ලෙස සැලකිය යුතු අතර මේ ආඥා පනතේ සඳහන් කිසිවක් එබඳු යම් සංගමයක් හෝ සංයුක්තයක් කෙරෙහි නැතහොත් ඒ සම්බන්ධයෙන් අදාල නොවිය යුතුයි.

මේ උපවගන්තියෙහි

(අ)අධිකරණ නිලධාරියා යන්නෙන් 1946 ලංකා (ආණ්ඩුකරණ) (ආණ්ඩුක්‍රම) රාජ්‍ය සභා ආඥාවේ අර්ථය අනුව අධිකරණ ධූරයක් දරන තැනැත්තෙක් අදහස් වේ.

(ආ)සන්නද්ධ හමුදා යන්නෙන් ලංකා යුධ හමුදාව රාජකීය ලංකා නාවික හමුදාව සහ රාජකීය ලංකා ගුවන් හමුදාව අදහස් වේ.

(ඇ) පොලිස් නිලධාරියා යන්නෙන් පොලිස් ආඥා පනත යටතේ පිහිටවනු ලැබූ පොලිස් හමුදාවේ සාමාජිකයෙක් අදහස් වේ. තවද

(ඈ)බන්ධනාගාර නිලධාරියා යන්නෙන් බන්ධනාගාර ආඥා පනතෙහි දී ඇති අර්ථයම තිබෙන නමුදු යම් බන්ධනාගාරයක කාර්ය මණ්ඩලයෙහි තත් කාලයේදී නියුක්ත යම් වෛද්‍ය නිලධරයෙක් හෝ ඇපෝතිකරි කෙනෙක් එයට ඇතුලත් නොවේ.

21. (1) මේ කොටස අදාල වන යම් වෘත්තීය සමිතියක් ව්‍යවස්ථාවල පහත සඳහන් විධිවිධාන ඇතුලත් වී නම් මිස රෙජිස්ට්‍රාර් විසින් ඒ සමිතිය ලියාපදිංචි නොකල යුතුය.

(අ) හුදෙක් රජයේ යම් එක් නිශ්චිත දෙපාර්තමේන්තුවක හෝ රජයේ යම් එක් නිශ්චිත සේවයක නැතහොත් රජයේ නොයෙක් දෙපාර්තමේන්තුවල සේවයෙහි යොදවනු ලැබ සිටියද නියුක්ත කාර්යයෙහි ස්වභාවය අනුව යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අයත් රජයේ සේවකයන්ටම සමිතියේ සාමාජිකත්වය හෝ (අනුශාසක ධූරය) , පඩි සහිත හෝ නිර්වේතන) කවර හෝ ධූරයක් ලබා ගැනීමට ඇති සුදුසුකම් සීමා කෙරෙන විධිවිධානයක්.

එසේ වුවද, එක් තැනැත්තෙකු සමිතියේ සභාපති හෝ ලේකම්ව ද අනෙක් තැනැත්තා සමිතියෙ සාමාජිකයෙකුවද සාමාජිකත්වය දැරීම හෝ ධූර දැරීම සඳහා තැනැත්තන් දෙදෙනෙකු අවස්ථාවොචිත පරිදි ඒ දෙපාර්තමේන්තුවට හෝ රජයේ ඒ සේවය පන්තියට හෝ වර්ගයකට පිටින් සමිතියේ වාර්ෂික මහා සභා රුස්වීමකදී තෝරා ගැනීමට ඒ විධිවිධානවල අවසර තිබිය හැකිය.

(අ)සාම නිලධරයන්ගේ හෝ රජයේ මාණ්ඩලික නිලධරයන්ගේ සමිතියක් වූ විටක (අ) ඡේදයෙහි සඳහන් විධිවිධානවලට අතිරේක වශයෙන්ය.

(1)ඒ සමිතියේ රජයේ සේවකයින්ගේ වෘත්තීය සමිතියක් වූ හෝ නොවූ වෙන යම් වෘත්තීය සමිතියක් සමග අනුබද්ධ කිරීම හෝ ඒකාබද්ධ කිරීම හෝ සංයුක්ත කිරීම නොකලයුතු බව ප්‍රකාශ කරන විධිවිධානයක් සහ

(2)මේ ආඥා පනතේ 47 වන වගන්තියේ අර්ථය අනුව දේශපාලන පරමාර්ථ හෝ දේශපාලන අරමුදලක් ඒ ඒ සමිතියට නොතිබිය යුතු බව ප්‍රකාශ කෙරෙන විධිවිධානයක්
එහි ඇතුලත් විය යුතුය.

මේ උප වගන්තියෙහි සහ 23 වන වගන්තියෙහි ඃ-

(අ) සාම නිලධාරියා යන්නෙහි අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි ඇති අර්ථයම තිබිය යුතු අතර,

(ආ) රජයේ මාණ්ඩලික නිලධාරියා යන්නෙන් මසකට රු.560 කට අඩු නො වන වැටුපකින් ආරම්භ වන වැටුප් ක්‍රමයක් ඇති ධූරයක් දරන රජයේ නිලධාරියා විය යුතුය.

22.යම්කිසි වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් (1) වෙනි උපවගන්තිය යටතේ කරන සෑම ඉල්ලීමකම --

(අ) සමිතිය වගඋත්තරකාරයෙකු හැටියට නම් කල යුතුය.

(ආ) ඉල්ලීම කරන්නේ කවර කරුණු උඩද යන්න සඳහන් කල යුතුය.

(ඇ) ඇටර්නි ජනරල් තැන හෝ ඔහු වෙනුවට සොලිසිටර් ජනරාල් තැන හෝ අත්සන් කොට තිබිය යුතුය.

(3) (1) වෙනි උප වගන්තිය යටතේ දිස්ත්‍රික් උසාවියට ඉල්ලීමක් කල විට උසාවිය විසින් විභාගයක් පවත්වා අවශ්‍ය යැයි හැගෙන සාක්ෂි අසා සටහන් කල යුතුය.තවද එබඳු විභාගයක් සඳහා සිවිල් නඩුවකදී දිස්ත්‍රික් උසාවියට හිමි සියළු ම බලතල එම උසාවියට තිබෙනවත් හැර ඒවා එසේම පාවිච්චි කල යුතුය.

(4) මෙම පනත යටතේ ඉල්ලීමක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් උසාවිය විසින් කරන ලද ආඥාවක් උසාවිය විසින් 16 වෙනි වගන්තිය යටතේ කරන ලද ආඥාවක් සේ සැලකිය යුතුවේ.තවද 17 වෙනි වගන්තියේ විධිවිධාන යථා පරිදි අදාල වන්නේය.

(5) වෙනත් ලිපිගත නීතියක කෙසේ සඳහන් වී තිබුණු නමුදු මෙම වගන්තිය යටතේ කරන ඉල්ලීමක් සඳහාවත් එබඳු ඉල්ලීමක් නිසා ඇතිවන විභාගයක් සඳහාවත් එබඳු විභාගවකදී ඉදිරිපත් කරන ලද ලේඛනයක් සඳහාවත් මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.

(6) මෙම වගන්තියෙහි (1) වෙනි උපවගන්තියෙහි සඳහන් නොවන යම්කිසි කරුණකට යම් වෘත්තීය සමිතියක ලියාපදංචි කිරීමේ සහතික ප්‍රකාශය අස්කරගැනීමට හෝ අවලංගු කිරීමට ලේකම් තැනට ඇති බලයට හානියක් වන ලෙසට මෙම පනතෙහි විධිවිධාන නොසැලකිය යුතුය. නැතහොත් තේරුම් නොගත යුතුය

*මේ ආඥාපනතේ ඇතැම් විධිවිධාන ඇතැම් වෘත්තීය සමිතිවලට අදාල නොවිය යුතු බව*

23 (1) 32 වන වගන්තියේ විධිවිධාන මෙම කොටස අදාල වන යම් වෘතිතීය සමිතියකට අදාල නොවිය යුතුය.

24 (2) 34 වන වගන්තියේ සහ 47 වන වගන්ති වල විධිවිධාන සාම නිලධරයන්ගේ හෝ රජයේ මාණ්ඩලික නිලධරයන්ගේ යම් වෘත්තීය සමිතියකට අදාල නොවිය යුතුය.

## V වෙනි කාණ්ඩය

## *වෘත්තීය සමිති වල අයිතිවාසිකම් හා වගකීම්*

*ලියාපදිංචි නොකරන ලද වෘත්තීය සමිති වලට බාධා*

25.වෘත්තීය සමිතියක් විසින් එය ලියාපදිංචි කරන තෙක් ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියකට හිමි අයිතවාසිකමක් හෝ විශේෂ මුක්තියක් හෝ විශේෂ බලයක් පාවිච්චි කල යුතු නොවේ.

*සමහර අවස්ථාවන්හි සිවිල්නඩුවලින්ලැබෙන විශේෂ මුක්ති*

26.යම්කිසි වෘත්තීය සමිතියක සාමාජිකයෙකු කාර්මික ආරවුලකට පාර්ශවකාරයෙකුව සිටින අවස්ථාවකදී එම ආරවුල ඇති කිරීම සඳහා හෝ දියුණු කිරීම සඳහා එම වෘත්තීය සමිතිය හෝ එහි නිලධාරියෙකු හෝ එහි සාමාජිකයෙකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම ක්‍රියාව අන් කිසිවෙකුට සේවා ගිවිසුමක් කඩ කිරීමට පෙලඹීමක් වීම නැතහොත් එම ක්‍රියාව අන් කිසිවෙකුගේ වෘත්තීය ව්‍යාපාරය නොහොත් රක්ෂාවද නැතහොත් යමෙකුගේ මුල් මුදල හෝ සේවක සංඛ්‍යාවද වුවමනා පරිදි යෙදවීම යන කරුණකට බාධා වීම යන කරුණක් නිසාම, එබඳු වෘත්තීය සමිතියකට, නිලධාරියෙකුට නැතහොත් සාමාජිකයෙකුට විරුද්ධව යම්කිසි නඩුවක් හෝ නීති කෘත්‍යයක් සිවිල් උසාවියකට පැවරිය නොහැකිය.

*වෘත්තීය සමිතියක් සිවිල් වරදවලට වගකීමට බැඳී නැති බව*

27.කාර්මික ආරවුලක් අදහස් කොට හෝ එයට අනුබල දීම් වශයෙන් හෝ වෘත්තීය සමිතියක් විසින් හෝ එබඳු සමිතියක් උදෙසා හෝ කරන ලදැයි සලකන වරදක් සම්බන්ධයෙන් වෘත්තීය සමිතියකට සාමාජිකයන්ට හෝ නිලධාරීන්ට හෝ ඔවුන් සහ සියලු සාමාජිකයන් වෙනුවෙන් විරුද්ධව පවරන ලද නඩුවක් කිසිම උසාවියක් විසින් පිළිනොගත යුතුය.

*ගිවිසුම් පිළිඹඳව වගකීම්*

28.වෘත්තීය සමිතියක් බැඳුන හෝ එය වෙනුවට නයෝජිතයෙකු බැඳුන හෝ සියලුම ගිවිසුම් සම්බන්ධයෙන් එම වෘත්තීය සමිතිය වගකිය යුතුය.එසේ වුවද එබඳු සමිතියක් නිෂ්ප්‍රභා වූ නැතහොත් නීතිය අනුව ක්‍රියාවෙහි යෙදවිය නොහැකි වූ ගිවිසුම් වලට එසේ වගකිව යුතු නොවන්නේය.

*ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක කර්මාන්ත අවහිර කිරීමේ පරමාර්ථ තිබීම නීති විරෝධී නොවන බව*

29.ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක පරමාර්ථයන් කර්මාන්තවලට අවහිර කිරීම සඳහා වූ පමණින්ම එබඳු වෘත්තීය සමිතියක සාමාජිකයෙකුට විරුද්ධව කුමණ්ත්‍රණය කිරීම ගැන හෝ වෙනත් චෝදනාවක් පිට හෝ අපරාධ නඩුවක් පැවරීමට හේතුවිය හැකි පරිදි නැතහොත් ගිවිසුමක් හෝ භාරයක් අවලංගු වීමට හෝ අවලංගු කිරීමට භාජන විය හැකි පරිදි නීති විරෝධී වන්නාක් මෙන් නොසැලකිය යුතුය.

*වෘත්තීය සමිතියක් විසින් නඩු පැවරීම සහ ඊට විරුද්ධව*

30. (1) ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියකට එම සමිතියේ ලියාපදිංචි කල නමින් සිවිල් නඩු පැවරීමට ද විරුද්ධව සිවිල් නඩු පවරනු ලැබීමද අපරාධ නඩු පවරනු ලැබීමටද පිළිවන.

(2)ලියාපදිංචි නොකරන ලද වෘත්තීය සමිතියකට වරුද්ධව සිවිල් හෝ අපරාධ නඩු ලැබිය හැකි වන්නේ එහි කටයුතු කර ගෙන යන නැතහොත් එය සාමාන්‍යයෙන් මහජනයා අතර ප්‍රසිද්ධ වී තිබෙන නාමයෙනි.

(3) ලියාපදිංචි කිරීම අවලංගු කරන ලද හෝ අස්කර ගන්නා ලද වෘත්තීය සමිතියකට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩු පැවරීම එය ලියාපදිංචි කල නාමයෙන් කල හැකිය.

(4)සිවිල් නඩුවකින් වෘත්තීය සමිතියකින් ලබාගන්නා ලද මුදලක් අයකර ගැනීම සඳහා එම වාත්තීය සමිතියේ ශුභසාධක අරමුදලට අයත් නොවන එම සමිතියට අයිති නැතහොත් එම සමිතිය භාරයේ ඇති කවර දේපලකට විරුද්ධව නමුදු "ඇස්කිසි" නිකුත් කල හැකිය.

(5) වෘත්තීය සමිතියක් විසින් ගෙවීමට නියම කරනු ලැබූ දඩ මුදලක් එම වෘත්තීය සමිතියට අයිති හෝ එය භාරයේ ඇති චංචල දේපලක් අපරාධ නඩු විධාන සංග්‍රහයේ ප්‍රකාර තහනම් කොට විකිනීමෙන් අයකර ගත හැකිය.

(6) යටත් පිරිසෙයින් භාරකාරයන් දෙදෙනෙකු විසින් අත්සන් කරන ලද පෙරකලාසියක් ඕනෑම උසාවියක හෝ ඕනෑම වෙනත් සිවිල් හෝ අධිකරණ විභාගයකදී හෝ ඉදිරිපත් කිරීමට ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියකට බලය ඇත්තේය.

## VI වෙනි කාණ්ඩය

## *ව්‍යවස්ථා*

*බාල වයස්කාරයින්ගේ සාමාජිකත්වය*

31.වයස අවුරුදු විසිඑකට අඩු නමුත් අවුරුදු 16 වැඩි යමෙකුට වෘත්තීය සමිතියක ව්‍යවස්ථාවල විධිවිධාන වලින් විරුද්ධත්වයක් නොමැති විටක ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සාමාජිකයෙකු වීමට පිළි වන. තවද මෙහි පහත දැක්වෙන්නක් හැර වෘත්තීය සමිතියෙහි ව්‍යවස්ථාවලට යටත්ව සාමාජිකයෙකුට අයිති සෑම බලයක්ම භුක්ති විඳීමටද සියලුම ඔප්පු අත්සන් කිරීමටද ව්‍යවස්ථා යටතේ අත්සන් කල යුතු හෝ දිය යුතු සියලු කුවිතාන්සි අත්සන් කොට දීමටද ඔහුට බලය තිබේ. නමුත් ඔහු ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක කාරක සභිකයෙකු හෝ භාරකාරයෙකු නොවිය යුතුය.

*වෘත්තීය සමිතියක නිලධාරීහු*

32. (1) සෑම වෘත්තීය සමිතියකම නිලධාරීන්ගේ මුළු ගණනින් දෙකෙන් කොටසකට අඩු නොවන ගණනක් වෘත්තීය සමිතිය සම්බන්ධ වී තිබෙන කර්මාන්තයෙහි හෝ වෘත්තියෙහි ඇත්ත වශයෙන්ම යෙදී සිටින නැතහොත් සේවය කරන අයගෙන් තෝරා පත් කර ගත යුතුය.

(2)විශේෂ හෝ සාමාන්‍ය ආඥාවක් ගැසට් පත්‍රයෙහි පල කිරීමෙන් මෙම වගන්තියෙහි සඳහන් විධිවිධාන එම ආඥාවෙහි දක්වනු ලැබූ ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියට හෝ ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති වර්ගයට අදාල නොවන බැව් ප්‍රකාශ කිරීමට ඇමතිවරයාට පිළිවන.

*නම වෙනස් කිරීම*

33. ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියකට එම සමිතියේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකොටසකට අඩු නොවන ගණනක කැමැත්ත ඇතිවද 35 වෙනි වගන්තියේ විධිවිධානවලට යටත්වද සමිතියේ නම වෙනස් කල හැකිය.

*ඒකාබද්ධ කිරීම*

34.වෘත්තිය සමිති 2ක් හෝ ඊට වැඩි ගණනක් එබඳු වෘත්තිය සමිතිවල හෝ ඉන් යමක අරමුදල් විසුරුවා හැර හෝ බෙදා නැතහොත් එසේ නොකොට එකට ඒකාබද්ධ කල හැකිය.එසේ කල හැකි වන්නේ එබඳු වෘත්තිය සමිති එකක් පාසා හෝ සෑම වෘත්තිය සමිතියකම ඡන්දය හිමි සාමාජිකයන්ගේ දෙකෙන් කොටසකගේ ඡන්දය සටහන් කල විට සහ යටත් පිරිසෙයින් ඉන් ඡන්ද සියයකට හැටක් එම යෝජනාවට පක්ෂව ලැබුණු විටද වේ.

***නම වෙනස් කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ දැන්වීම***

35. (1)සෑම නම් වෙනස් කිරීමක් සහ ඒකාබද්ධ කිරීමක්ම ලේකම් තැන වෙත ලියවිල්ලකින් දැන්විය යුතුය.නම් වෙනස් කිරීමකදී නම් වෙනස් කරන වෘත්තිය සමිතියේ ලේකම් තැන සහ සාමාජිකයන් හත් දෙනෙකු විසින්ද ඒකාබද්ධ කිරීමකදී එම ඒකාබද්ධ කිරීමකට සම්බන්ධවූ සෑම වෘත්තිය සමිතියකම ලේකම් තැන සහ එබඳු එක් එක් සමිතියෙන් සාමාජිකයන් හත් දෙනෙකු විසින්ද එම ලියවිල්ලෙහි අත්සන් තැබිය යුතුය.

(2)යෝජනා කරන ලද නම එවකට පවත්නා ලියාපදිංචි කරන ලද වෙනත් වෘත්තිය සමිතියක නම සහ සමාන නම් නැතහොත් ලේකම් තැනගේ අදහස පරිදි එය මහජනයා හෝ වෘත්තිය සමිතියක සාමාජිකයන් හෝ නොමග යවන ප්‍රමාණයට කලින් කියන ලද සමිතියක නමකට සමානකම් තිබේ නම් එම නම වෙනස් කිරීම ලේකම්ට ප්‍රතික්ෂේප කළ හැකිය.

(3)(2) වෙනි උපවගන්තියෙන් නියම කොට තිබෙන පරිදි හැර අන් සෑම අවස්ථාවලදීම නම වෙනස් කිරීම සම්බන්ධයෙන් මෙම පනතෙහි විධිවිධාන ඉෂ්ට කොට තිබෙන බැව් ලේකම් තැනට ඒත්තු ගිය විට එම නම වෙනස් කිරීම නියමිත ප්‍රකාරයට ඔහු විසින් ලයාපදිංචි කල යුතුය.තවද එම ලියාපදිංචි කිරීමේ දිනය සිට එම වෙනස් කිරීම බල පවත්වන්නේය.

(4) ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් මෙම පනතෙහි විධිවිධාන ඉෂ්ට කොට තිබෙන බවද එම නිසාම එම වෘත්තිය සමිතිය 10 වෙනි වගන්තිය යටතේ ලියා සඳහන් කරවා ගැනීමට සුදුසු බවද ලේකම් තැනට ඒත්තු ගිය විට නියමිත ප්‍රකාරයට ඔහු විසින් ඒ වෘත්තිය සමිතිය ලියාපදිංචි කල යුතුය. එම ලියාපදිංචි කිරීමේ දිනය සිට එබඳු ඒකාබද්ධ කිරීමක් බලපවත්වන්නේය.

(5)ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියක නම වෙනස් කිරීම හෝ වෘත්තිය සමිති 2ක් හෝ ඊට වැඩි ගණනක් ඒකාබද්ධ කිරීමෙන් සෑදුනු වෘත්තිය සමිතියක් හෝ ලියාපදිංචි කිරීම ලේකම් තැන විසින් ප්‍රතික්ෂේප කිරීම පිලිබඳව අතෘප්ත වූ යම් කිසිවෙකු විසින් එබඳු ප්‍රතික්ෂේප කිරීමකට විරුද්ධව එම ප්‍රතික්ෂේප කිරීමේ දිනයේ සිට තිස් දවසක් ඇතුලතදී දිස්ත්‍රික් උසාවියට ඇපැල් පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් ඇපැල් ගත හැකිය.

(6) (5) වෙනි උපවගන්තිය යටතේ කරන සෑම ඇපැලක් සඳහාම පහත දැක්වෙන දේ කළ යුතුය.

(අ)ලේකම් තැන වගඋත්තරකරු වශයෙන් නම් කිරීම

(ආ)ඇපැලට හේතු වූ කරුණු සහ ඇපැල ඉදිරිපත් කිරීමට හේතු වුණු ප්‍රතික්ෂේප කිරීමේ දිනය සඳහන් කිරීම.

(ඉ)ඇපැල්කරු විසින් අත්සන් කිරීම සහ

(ඊ)රුපියලක වටිනාකමැති මුද්දරයක් ඇලවීමද කල යුතුයි.

(7) (5)වෙනි උපවගන්තිය යටතේ ගනු ලබන ඇපැලකදී පහත දැක්වෙන කටයුතු කිරීමට දිස්ත්‍රික් උසාවියට බලය තිබේ.

(අ)ඇපැල්කරුට හෝ ලේකම් තැනට හෝ වැඩිපුර තොරතුරු සැපයීමට නියම කිරීම

(ආ)විභාගයක් පවත්වා අවශ්‍ය යයි හැඟෙන සාක්ෂි අසා සටහන් කර ගැනීම.

(ඉ)ඇපැලට ඉඩ හරිමින් ලේකම් තැනගේ නියමය අස් කිරීම.

(ඊ) ඇපැල නිෂ්ප්‍රභා කිරීම හෝ

(උ)සාධාරණ යයි හැගෙන නියමයක් කිරීම සහ ඇපැල් ගාස්තු සහ ඇපැල ඇසීමේදී අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටිය ඇතුළුව අවශ්‍ය යයි හැගෙන වෙනත් නියම කිරීම් ද වේ.

(8) (6) වෙනි උපවගන්තියෙන් නියම කරන ලද අවස්ථා වල හැර මුද්දර පනතෙහි හා සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි කාර්ය සඳහා (5) වෙනි උපවගන්තිය යටතේ කරනු ලබන ඇපැලක් රුපියල් 300 ක වටිනාකමැති සිවිල් නඩුවක් ලෙස සැලකිය යුතුය.

(9)ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක නම වෙනස් කිරීම ප්‍රතික්ෂේප කරමින් ලේකම් තැන විසින් කරන ලද තීරණයකට විරුද්ධව ගන්නා ලද ඇපැලක් සම්බන්ධයෙන් මෙම පනතෙහි දිස්ත්‍රික් උසාවිය යන්නෙන් අදහස් කරන්නේ එම වෘත්තිය සමිතියෙහි ලියාපදිංචි කරන ලද කාර්යාලය පිහිටි ප්‍රදේශයේ අධිකරණ බලය හිමි දිස්ත්‍රික් උසාවියයි.එසේම ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිති දෙකක් හෝ වැඩිගණනක් ඒකාබද්ධ කිරීමෙන් සෑදුනු වෘත්තිය සමිතියක් ලියාපදිංචි කිරීමක් ලේකම් තැන විසින් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවකදී දිස්ත්‍රික් උසාවිය යන්නෙන් අදහස් කරනු ලබන්නේ එබදු ඒකාබද්ධ කිරීමකින් සෑදුනු වෘත්තිය සමිතියෙහි ප්‍රධාන කාර්යාලය වශයෙන් ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන ස්ථානයේ අධිකරණ බලය හිමි දිස්ත්‍රික් උසාවිය වේ.

(10) (7) වෙනි උපවගන්තිය යටතේ දිස්ත්‍රික් උසාවිය විසින් කරන ලද ආඥාවකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ඇපැල් ගැනීමට බලය තිබේ.එබදු ඇපැලක් සම්බන්ධව වූ සියලුම කරුණු වලදී සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන පරිදි අදාල විය යුතුය.

***නමවෙනස් කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵල***

36. (1) ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියක නම වෙනස් කිරීමෙන් එම සමිතියේ අයිතිවාසිකම් වලට හා වගකීම් වලට හානියක් නොවන අතරම එම සමිතිය විසින් පවරන ලද යම්කිසි නීති කෘත්‍යයක් හෝ සමිතියට විරුද්ධව පවරන ලද නීති කෘත්‍යයක් හෝ දෝෂ සහිත නොවන්නේය.තවද එහි පලමුව තිබුණ නමින් එය විසින් හෝ එයට විරුද්ධව හෝ ගෙන යන ලද හෝ පටන් ගන්නා ලද හෝ යම්කිසි නීති කෘත්‍යයක් අලුත් නමින්ද එලෙසම ගෙන යාමට හෝ පටන් ගැනීමට හෝ පිළිවන.

(2)වෘත්තිය සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් ඒකාබද්ධ කිරීමකින් එබදු වෘත්තිය සමිතියක හෝ එබදු සමිතියක ණය හිමියෙකුගේ හෝ අයිතිවාසකමකට හානියක් නොවන්නේය.

***ලියාපදිංචි කරන ලද කාර්යාලය***

37.(1) සෑම ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියකට ම සියලු ලියුම් කියුම් සහ දැන්වීම් යැවිය යුතු ලියාපදිංචි කරන ලද කාර්යාලයක් තිබිය යුතුය.

(2)එබදු ලියාපදිංචි කරන ලද කාර්යාලයක් පිහිටි ස්ථානයද එය වෙනස් කිරීමක් ඇති වුවහොත් එයද ලේකම් තැනට දැන්විය යුතු වත් හැර ඒ ස්ථාන ඔහු විසින් ලියාපදිංචි කල යුතුය.එබදු දැන්වීමක් කරන තෙක් එම වෘත්තිය සමිතිය මෙම පනතෙහි විධිවිධාන ඉෂ්ට කළ යේ සලකනු නොලැබේ.

(3) පහත සඳහන් අන්දමේ සෑම වෘත්තිය සමිතියක්ම මහේස්ත්‍රාත් කෙනෙකු විසින් කරන ලද නඩු විසදීමකදී වරදකාරයා වී එසේ කටයුතු ගෙන යන සෑම දවසකට රුපියල් දහයකට වැඩි නොවන දඩයකට යටත් වන්නේය.එසේම එබදු වෘත්තිය සමිතියක සෑම නිලධාරියෙක්ම එම වරදට වරදකාරයා වී එබදු දඩයකට යටත් වන්නේය.එනම්--

(අ)ලියාපදිංචි කරන ලද කාර්යාලයක් නොමැතිව නැතහොත් මීට ඉහතින් නියම කරන ලද පරිදි එහි ලියාපදිංචි කරන ලද කාර්යාලය පිහිටි ස්ථානය නොදන්වා කටයුතු ගෙන යාම නැතහොත්

(ආ) එහි ලියාපදිංචි කරන ලද කාර්යාලය වෙන ස්ථානයකට ගෙන ගොස් එසේ ගෙන ගිය ස්ථානය ලේකම් තැනට නොදන්වා කටයුතු ගෙනයාම ද වේ.

*ව්‍යවස්ථා*

38 (1) පළමුවෙනි උප ලේඛනයේ සඳහන් සියලු කරුණු සඳහාම ලියාපදිංචි කරන ලද සෑම වෘත්තීය සමිතියකම ව්‍යවස්ථා සකස් විය යුතුය.

(2) ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක එවකට බල පවත්නා ව්‍යවස්ථාවල පිටපතක් එහි ලියාපදිංචි කරන ලද කාර්යාලයෙහි පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශණය කොට තැබිය යුතුය.තවද ශත පනහකට වැඩිනොවන මුදලක් ගෙවා ඉල්ලූ අයෙකුට එහි ලේකම් තැන විසින් ඉන් පිටපතක් සැපයිය යුතුය.

(3)ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සෑම අලුත් ව්‍යවස්ථාවක හා එහි ව්‍යවස්ථා පිළිබඳව කරන ලද සෑම වෙනස් කිරීමකද පිටපතක් එබඳු ව්‍යවස්ථාවක් සාදා හෝ එබඳු වෙනස් කිරීමක් කිරීමෙන් හෝ දින සතක් ඇතුලතදී ලේකම් තැන වෙත යැවිය යුතුය.එවිට නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු ඔහු විසින් එය ලියාපදිංචි කල යුතුය.

(4) වෘත්තීය සමිතියක ව්‍යවස්ථා ඉංග්‍රීසියෙන් හෝ සිංහලෙන් හෝ දෙමළෙන් හෝ සැදිය හැකිය.

*නිලධාරීන් වෙනස් කිරීම ආදිය පිළිඹද දන්වීම*

39.නිලධාරීන් පිළිබඳව හෝ නිලධාරීන්ගේ පදවිය පිළිබඳව හෝ කරනු ලබන සියලුම වෙනස් කිරීම් සම්බන්ධ දැන්වීම් ලියාපදිංචි කරන ලද සෑම වෘත්තීය සමිතියක ලියාපදිංචි කරන ලද කාර්යාලයෙහි පැහැදිලිව පෙනෙන සේ ප්‍රදර්ශනය කොට තැබිය යුතුය.එසේ වෙනස් කිරීම් කිරීමෙන් දින හතක් ඇතුලතදී එම වෘත්තීය සමිතිය විසින් එම දැන්වීම් නියමිත ගාස්තුවක් සමග ලේකම් තැන වෙත යැවිය යුතුය.එවිට ඔහු විසින් යථා පරිදි නාම ලේඛනය නිවැරදි කල යුතුය.

*විසුරුවා හැරීමේ දැන්වීම*

40. ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක් විසුරුවා හැරි විට එසේ විසුරුවා හැර දින දහ හතරක් ඇතුලතදී විසුරුවා හැරීමේ දැන්වීමක් එම වෘත්තීය සමිතියෙහි සාමාජිකයන් සත් දෙනෙකු සහ සමිතියේ ලේකම් තැන විසින්ද අත්සන් කොට ලේකම් තැනට යැවිය යුතුය.වෘත්තීය සමිතියෙහි ව්‍යවස්ථා වලට අනුකූලව විසුරුවා හැරීම කර තිබෙන බව ලේකම් තැනට ඒත්තු ගිය හොත් ඔහු විසින් එය ලියාපදිංචි කල යුතුය.එසේ ලියාපදිංචි කිරීමේ දින සිට එම විසුරුවා හැරීම වලංගු වන්නේය.

*භාරකාරවරු*

41. (1) සමිතියක භාරකරුවන් යටත් පිරිසෙයින් තුන් දෙනෙකු සෑම වෙලේම සිටින පරිදි භාරකරුවන් පත් කිරීමට හෝ තෝරා ගැනීමටද භාරකාර නිලයේ පුරප්පාඩු පිරවීමටද  වෘත්තීය සමිතියක ව්‍යවස්ථාවලින් ඉඩ සලසා තිබිය යුතුය.

(2) ලියාපදිංචි කරන ලද කරන ලද වෘත්තීය සමිතියක නිලධාරියෙකුට හෝ එහි සාමාජිකයෙකුට භාරකාරයෙකු වීමට පිළිවෙන.

## VII වෙනි කාණ්ඩය

*සියලුම දේපල වල අයිතිය භාරකාරවරුන් මත පැවරෙන බව*

42.ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සියලුම චංචල හෝ නිශ්චල දේපල වල අයිතිය සමිතියෙහි සහ එහි සාමාජිකයන්ගේ ප්‍රයෝජනය හා ශුභසිද්ධිය සඳහා භාරකාරවරුන් මත පැවරෙන්නේය.තවද ඒවා භාරකරුවන්ගේ පාලනයටද යටත් වන්නේය.

*දේපල අයිති වීම*

43.භාරකාරයෙකුගේ ධූරය වෙනස් වීමකදී ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක දේපල වල අයිතිය ප්‍රථම භාරකාරයාට තිබූ බලතල හා අයිතිවාසිකම් සහිතවම හිමිකර දමක් හෝ පවරා දීමක් නොමැතිව එවකට සමිතියෙහි වූ භාරකාරයා වෙත හෝ භාරකාරයින් වෙත පැවරෙන්නේය.

*ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීම හෝ බදු ගැනීම*

44.ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියකට සමිතියේ ව්‍යවස්ථාවල විධිවිධාන වලට යටත්ව සමිතියේ කාර්ය සඳහා එහි භාරකරුවන්ගේ නමින් ප්‍රමාණයෙන් අක්කරයකට වැඩිනොවන ඉඩමක් හෝ ගොඩනැගිලි මිලයට හෝ බද්දට ගැනීම නීත්යානුකූලය. තවද එලෙස මිලයට ගන්නා ලද ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අදාල විය හැකි ලිපියක හෝ වෙනත් නීතියකට යටත්ව විකිණීම හෝ හුවමාරු කර ගැනීම හෝ උකස් කිරීම හෝ බදු දීම හෝ නිත්‍යානුකූලය.

## VIII වෙනි කාණ්ඩය

### *අරමුදල් සහ ගණන්*

*අරමුදල් යෙදීම*

45.ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියක අරමුදල් එහි ව්‍යවස්ථා වලට හා මෙම පනතෙහි විධිවිධානවලට යටත්ව එම වෘත්තිය සමිතිය පිහිටුවීමට හේතු වූ නිත්‍යානුකූල පරමාර්ථයන් ඉෂ්ට කර ගැනීම සඳහා යෙදිය හැකිය.

*සමිතියක අරමුදල් නොයෙදියයුතු කාර්යය*

46.උසාවියක ආඥාවකින් හෝ දණ්ඩන නියමයකින් හෝ යමෙකුට නියම කරන ලද දඩයක් හෝ දඩුවම් මුදලක් ගෙවීම සඳහා ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියක අරමුදල් නියම ලෙස හෝ අනියම් ලෙස හෝ නොයෙදිය යුතුය.

*දේශපාලන පරමාර්ථසහ දේශපාලන අරමුදල*

47. (1) මෙම පනතෙහි මින් මතු දෙශපාලන අරමුදල යයි කියනු ලබන වෙන් වූ අරමුදල් වෙන් වශයෙන් එම අරමුදල වෙනුවෙන් අය කරනු ලබන නැතහොත් දෙනු ලබන ආධාර මුදල් වලින් පිහිටුවීමට ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියකට පිළිවන.(2) වෙනි උප වගන්තියෙහි දැක්වෙන මෙම පනතෙහි මින් මතු දේශපාලන පරමාර්ථ යයි කියන ලබන පරමාර්ථ වලින් යම් කිසිවක් ඉෂ්ට කිරීමෙන් එම සමිතියෙහි සාමාජිකයන්ගේ පුරවැසි හා දේශපාලන අයිතිවාසිකම් වැඩිදියුණු කර ගැනීම සඳහා එම අරමුදල් ගෙවිය හැකිය.

(2)(1)වෙනි උපවගන්තියෙහි සඳහන් කරන ලද දේශපාලන පරමාර්ථයන් පහත දක්වනු ලැබේ. එනම්..

(අ)උත්තර මන්ත්‍රිවරයෙකු වශයෙන් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු වශයෙන් හෝ යම්කිසි පොදු ධූරයකට හෝ තෝරා ගැනීම පිණිස ඉදිරිපත් වූන නැතහොත් ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන අපේක්ෂකයෙකු විසින් තමන්ගේ ධූර අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම පිළිබඳව ඡන්ද විමසීමට පළමු හෝ ඡන්ද විමසීම අතරතුරදී නැතහොත් ඡන්ද විමසීමට පසුව නියම ලෙස හෝ අනියම් ලෙස දැරූ වියදම් ගෙවීම හෝ

(ආ)එබදු අපේක්ෂකයෙකුට හෝ තරග කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයෙකුට හෝ ආධාර කිරීම සඳහා රැස්වීමක් පැවැත්වීම හෝ ලිපි ලේඛන ආදිය බෙදා හැරීම හෝ

(ඇ)උත්තර මන්ත්‍රී ධූරයක් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයක් හෝ පොදු ධූරයක් හෝ දරන අයෙකු නඩත්තු කිරීම. හෝ

(ඇ)ඡන්දදායකයන්ගේ නාමලේඛන සම්පාදනය කිරීම හෝ සංශෝධනය කිරීම හෝ ඡන්දදායකයින්ගේ නම් ලියාපදිංචි කිරීම හෝ උත්තර මන්ත්‍රී ධූරයකට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයකට නැතහොත් පොදු ධූරයකට අපේක්ෂකයෙකු තෝරා ගැනීම හෝ

(ඉ)කොයියම් වර්ගයක වුවද දේශපාලන රැස්වීම් පැවැත්වීම හෝ දේශපාලන ලිපිලේඛන බෙදා

හැරීමද වේ.

මෙම උපවගන්තියෙහි පොදු ධූරයක් යන්නෙන් අදහස් කරන්නේ මහා නගර සභාවක හෝ දිස්ත්‍රික් නගර සභාවක හෝ ලෝකල් බෝර්ඩ් සභාවක හෝ සනීපාරක්ෂක සභාවක හෝ ගම් සභාවක නැතහොත් අයබදු හෝ වරිපනම් හෝ ගාස්තුවක් හෝ නියම කිරීමෙන් හෝ පැනවීමෙන් නියම ලෙස හෝ අනියම් ලෙස මුදල් එකතු කිරීමට බලය ඇති හෝ ඇතිවිය හැකි යම්කිසි ලිපිගත නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් ප්‍රාදේශික බලමණ්ඩලයක සහික ධූරයක්ය.

(3)දේශපාලන අරමුදලක් ඇති කිරීමේ යෝජනාවක් ඒ සඳහා විශේෂයෙන් රැස් කරවන ලද සාමාන්‍ය රැස්වීමකදී පැමිණ සිටි සාමාජිකයින් වැඩිදෙනෙකු පක්ෂව කැමැත්ත දීමෙන් සම්මත වන තුරු ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක් විසින් කිසි දේශපාලන අරමුදලක් ඇති නොකල යුතුය.එසේ කැඳවන ලද සාමාන්‍ය රැස්වීමෙහිදී ඡන්දය දීම නියමිත ප්‍රකාරයට ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් විය යුතුය.

(4)යම්කිසි දේශපාලන පරමාර්ථයක් ඉෂ්ට කර ගැනීම සඳහා එම සමිතියේ දේශපාලන අරමුදලෙන් හැර අන් කිසිම ගෙවීමක් වෘත්තීය සමිතියක් විසින් නොකල යුතුය.

(5)ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක කිසිම සාමාජිකයෙක් ඔහු විසින් දේශපාලන අරමුදලට ආධාර කිරීමේ කැමැත්ත දක්වා දෙවෙනි උපලේඛණයෙහි 1 වෙනි ආකෘති පත්‍රයට සාරානුකූල වූ දැන්වීමක් අත්සන් කොට සමිතියේ ලියාපදිංචි කරන ලද කාර්යාලයට බාරදී නැත්නම් සහ එම උපලේඛනයෙහි වූ II වෙනි ආකෘති පත්‍රයට සාරානුකූලව දැන්වීමක් අත්සන් කොට එම සමිතියේ ලියාපදිංචි කරන ලද කාර්යාලයට භාර දීමේ කලින් කී දැන්වීම ඉවත්කොටගෙන නැත්නම් එම දේශපාලන අරමුදලට ආධාර කිරීමට බැඳී නැත්තේය.

(6) (5)වෙනි උපවගන්තිය යටතේ දැන්වීමක් පුද්ගලිකව හෝ නියෝජිතයෙකු හෝ සේවකයෙකු මගින් හෝ භාරදිය හැකිය.ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියේ ලේකම් තැන නමට එහි ලියාපදිංචි කරන ලද කාර්යාලයට ලියාපදිංචි තැපැලෙන් එම දැන්වීම යැවීමෙන් නිසි පරිදි එය භාර දුන් ලෙස සලකනු ලැබේ.

(7) දේශපාලන අරමුදලට ආධාර කිරීමට බැඳී නොමැති කිසිම සාමාජිකයෙකුට එය ගෙවීමට බල නොකළ යුතුය ; නැතහොත් නියම නොකළ යුතුය.

(8) ලියාපදංචි කරන ලද වෘත්තීය සමිතියක සාමාජිකයෙකු එම වෘත්තීය සමිතියෙහි දේශපාලන අරමුදලට ආධාර කිරීමට බැඳී සිටින විට, ඔහුගෙන් එම අරමුදලට ආධාර ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම එම දේශපාලන අරමුදලට ඔහුගෙන් ඉල්ලා සිටින ආධාර මුදල් ප්‍රමාණය කොපමණ යන්න වෙන්ව සඳහන් කල යුතුය. තවද, එම සාමාජිකයා විසින් එම අරමුදලට ගෙවන ලද ආධාර මුදලට කුවිතාන්සියක් නිකුත් කිරීමේදී එම දේශපාලන අරමුදලට ඉහත කී සාමාජිකයා විසින් ගෙවිය යුතු ආධාර මුදලෙන් එවකට ගෙවිය යුතුව ඉතිරිව තිබෙන මුදල් ප්‍රමාණය වෙන් වශයෙන් ම එහි සඳහන් කළ යුතුය.

(9) දේශපාලන අරමුදලට ආධාර කිරීමට බැඳුණු සාමාජිකයන්ගේ ආධාර මුදල් ද, සාමාජිකයන් නොවන අයගෙන් එම අරමුදලට ලැබුණු පාරිතෝෂික මුදල් ද හැර වෘත්තීය සමිතියක වෙනත් වත්කමක් දේශපාලන අරමුදලට එක් නොකළ යුතුය. තව ද, දේශපාලන අරමුදලට හිමිකමක් ඇති අනික් වත්කමක් යම්කිසි දේශපාලන පරමාර්ථයක් ඉෂ්ට කර ගැනීම සඳහා නියම හෝ අනියම් ලෙස හෝ නොයෙදිය යුතුය.

(10) දේශපාලන අරමුදලට ආධාර නොකරන, ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සාමාජිකයෙකු ඒ නිසාම එයින් අස්කර දැමීම හෝ එම වෘත්තීය සමිතිය නිසා ලැබෙන ප්‍රයෝජනයක් ඔහුට අහිමි කිරීම හෝ එම සමිතියේ අනිකුදු සාමාජිකයන් හා සමාන කිරීමේදී ඔහු යම්කිසි දුර්වල තත්ත්වයක හෝ අවාසි තත්ත්වයක (දේශපාලන අරමුදල පාලන කිරීම සම්බන්ධයෙන් හැර වෙන කොයියම් ආකාරයකින් වුවද) නියම ලෙස හෝ අනියම් ලෙස තැබීම හෝ නොකළ යුතුය. තවද, දේශපාලන අරමුදලට ආධාර කිරීම එම වෘත්තීය සමිතියට සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් වීමේ

නියමයක් නොකළ යුතුය.

*බලය නොලත් හෝ නීති විරෝධී වියදම් වැලැක්වීම තහනම*

(48) බලාපොරොත්තු වන සහනයෙහි සෑහෙන තරමේ අයිතිවාසිකමක් ඇති අයෙකු විසින් හෝ ඇටර්නි ජනරාල් තැන විසින් හෝ ඉල්ලීමක් කළ විටකදී ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක අරමුදල් බලය නොලත් හෝ නීති විරෝධි හෝ කටයුතු වලට වියදම් කීරීම වලක්වන තහනමක් ලබා ගැනීමට පිළිවන.

*භාණ්ඩාගාරික තැන ගනුදෙනු ඉදිරිපත් කළ යුතු බව*

(49) (1) ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සෑම භාණ්ඩාගාරික කෙනෙකු විසින්ද එහි ගණන් ගැන හෝ මුදල් එකතු කිරීම හෝ වියදම් කිරීම හෝ තබා ගැනීම හෝ පාලනය ගැන හෝ වගකිව යුතු වෙනත් සෑම නිලධාරියෙකු විසින්ද ඔහු ධූරයෙන් ඉල්ලා අස්වන විට හෝ ධූරය හිස් කරන විටද, අවුරුද්දකට වරක් එම සමිතියෙහි ව්‍යවස්ථාවල දැක්වෙන පරිදි කාලයකදී ද එම සමිතියේ සාමාජිකයන් විසින් යෝජනාවකින් ඉල්ලන පරිදි හෝ එහි ව්‍යවස්ථාවල දැක්වෙන පරිදි අන්කිසි කාලයකදී ද ඔහු ධූරයට පත්වූ දින සිට පසුවුණු කාලය අතරතුර ලබන ලද හා ගෙවන ලද මුදල් පිලිබඳ ගණන් ලේඛනයක් වෘත්තීය සමිතියට හා එහි සාමාජිකයන්ට ඉදිරිපත් කළ යුතුය. එසේ නැත්නම් එම ලේඛනය ඔහු විසින් කලින් එබඳු ලේඛනයක් ඉදිරිපත් කළ අන්තිම දිනයේ සිට පසුවුණු කාලය පිළිබඳව විය යුතුය. තවද එබඳු ලේඛනයක් ඉදිරිපත් කරන වේලාවෙහි තමා ළඟ එවකට ඉතිරිව තිබෙන සියළුම මුදල් පිළිබඳවද තමාගේ අත්අඩංගුවට නැතහොත් පාලනයට භාර කරන ලද වෘත්තීය සමිතියට අයත් ඔප්පු, ඇප නැතහොත් වෙනත් දේපල පිළිබඳවද එහි සඳහන් විය යුතුය.

(2) ගණන් ලේඛනයෙහි ආකෘතිය නියෝගයකින් නියම කළ හැකිය.

(3) ගණන් ලේඛනය සත්‍යක බව දිව්රුම් පත්‍රකයකින් පෙන්නුම් කළ යුතුය. තවද ලේකම් තැන විසිඃ අනුමත කරනු ලැබූ සුදුසු කෙනෙකු ලවා සමිතිය විසින් එම ගණන් ලේඛනය පරීක්ෂා කරවා ගත යුතුය.

(4) ගණන් ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු සමිතියේ භාරකාරයන් විසින් නියම කරනු ලැබුවහොත් භාණ්ඩාගාරිකතැන හෝ (1) වෙනි උප වගන්තියෙහි සඳහන් නිලධාරියා හෝ ඔහුගෙන් අය වෙන්නට තිබෙන ලෙස පෙනී යන ඉතිරි මුදලක් වේතොත් එයද එසේම නියම කරනු ලැබුවහොත් ඔහු අත් අඩංගුවේ හෝ අන්කිසි අන්දමකින් ඔහුගේ පාලනය යටතේ තිබෙන සියළුම ඔප්පුද, ඇප මුදල් ද, බඩු බාහිරාදියද, පොත් ද, ලේඛන සහ වෙනත් දේපල ද එකී භාරකාරයන් වෙත වහා භාර දිය යුතුය.

*වාර්ෂික වාර්තාව*

(50) (1) ලියපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සෑම ලේකම් කෙනෙක්ම සෑම අවුරුද්දකම නියමිත දිනයේ හෝ ඊට පෙර ඊට ඉහතින් වූ මාර්තු මාසයෙහි 31 වෙනි දින දක්වා ඇති වූ දොලොස් මාසය තුල නියමිත ආකාරයට පරීක්ෂා කරනු ලැබූ, සියළුම ආදායම් හා වියදම් පිළිබඳවද එම මාර්තු මස 31වෙනි දිනයෙහි පැවැති සමිතියේ වත්කම හා ණය පිළිබඳව ද සාමාන්‍යව ප්‍රදකාශයක් අවුරුදු පතා ලේකම්තැනට සැපයිය යුතුය. පරීක්ෂක තැනගේ වාර්තාවෙහි පිටපතක්ද ඒ ලේඛනය සමගම යැවිය යුතුය. තවද, එම ලේඛනය නියමිත ආකෘතියකට අනුව, නියමිත විස්තර ඇතුලත් කොට සැපයිය යුතුය.

(2) ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සෑම ලේකම් කෙනෙකු විසින්ම එම මාර්තු මස 31 වෙනි දිනට ඉහතින් වූ දොලොස් මාසය ඇතුලත වෙනස් කරන ලද හෝ සංශෝධනය කරන ලද සියළු ව්‍යවස්ථාවන්ගේම පිටපතක් ද, පනවන ලද සියළු අළුත් ව්‍යවස්ථාවන්ගේම පිටපතක් ද, වෙනස් කං ලද සියළුම නිළධාරීන්ගේ නාම ලේඛනයක්ද, එදිනට වලංගුව ඇති එම වෘත්තීය සමිතියෙහි සියළුම ව්‍යවස්ථාවන්ගේම පිටපතක්ද, (1) වෙනි උප වගන්තියේ සඳහන් සාමාන්‍ය ප්‍රදකාශයක් සමග සැපයි යුතුය.

(3) මෙම පනත ක්‍රියාවේ යෙදීමට පෙර පිහිටුවන ලද ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් එම වෘත්තීය සමිතියෙහි මුදල් වර්ෂය අවසාන වන දිනය වෙනුවට, ඒ සම්බන්ධව ඉල්ලීමක් කළ විටක, (1) වෙනි සහ (2) වෙනි උප වගන්තිවල සඳහන් මාර්තු මස 31 වෙනි දිනය තමාගේ නමින් වූ ලියවිල්ලකින් නියම කිරීමට ලේකම්තැනට පිළිවන. තවද, වුවමනා නම් (1) වෙනි උප වගන්තියේ කාර්යය සඳහා නියමිත දිනයට වෙන දිනයක් නියම කිරීමට ද එසේම පිළිවන. එවිට එම ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතිය සම්බන්ධයෙන් එසේ නියම කරන ලද දිනය (1) වෙනි උප වගන්තියේ සඳහන් දිනය ලෙසද, දවස (1) වෙනි සහ (2) වෙනි උප වගන්තිවල සඳහන් දවස ලෙසද සැලකීමෙන් මෙම පනතෙහි සියළුම විධි විධාන යථා පරිදි අදාල වන්නේය.

(4) (1) වන උප වගන්තියෙහි සඳහන් කරන ලද සාමාන්‍යස ලේඛනයෙහි පිටපතක් නොමිලේ ලබා ගැනීමට ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සෑම සාමාජිකයෙකුටම අයිතිවාසිකම ඇත්තේය. එසේ ලේඛනයක් ඉල්ලන වෘත්තීය සමිතියක සෑම සාමාජිකයෙකුටම එහි ලේකම්තැන විසින් පිටපතක් භාර දිය යුතුය.

(5) මෙම වගන්තියේ අවශ්‍යස වන යමක් ඉෂ්ට නොකර පැහැර හරින ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක ලේකම් කෙනෙක් වරදකට වරදකාරයා වන්නේය. මහේස්ත්‍රයත්වරයෙකු විසින් කරන ලද නඩු විසඳීමකින් වැරදිකාරයා කිරීමේදී රුපියල් 100කට වැඩි නොවන දඩයකටද ඔහු යටත්

වන්නේය.

(6) ලේකම් තැනට භාර දෙන ලද (1) වෙනි සහ (2) වෙනි උප වගන්තිවල සඳහන් සාමාන්‍යන ප්‍රනකාශයක පිටපතක් හෝ ලේඛණයක වැරදි සටහනක් ඕනෑකමින්ම කරන හෝ කරවන හෝ කිරීම නියම කරන හෝ කරවා ගන්නා නැතහොත් යම් කිසි සටහනක් ඕනෑකමින්ම නොකර හරින හෝ නොකිරීමට නියම කරන සෑම කෙනෙක්ම වරදකට වරදකාරයා වී රුපියල් 100කට වැඩි නොවන දඩයකට හෝ තුන් මාසයකට වැඩි නොවන කාලයකට යන දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ නැතහොත් එබඳු දඩයකට සහ බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් වන්නේය.

***ගණන් පරීක්ෂා කර බැලීම සහ ලේඛන.***

(51) ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක ගණන් පොත්ද සාමාජික නාම ලේඛනයද වෘත්තීය සමිතියෙහි විය වස්ථාවල සඳහන් කොට තිබෙන වේලාවල සමිතියෙහි නිලධාරියෙකුට හෝ සාමාජිකයෙකුට පරීක්ෂා කර බැලීමට ඉඩ හැර තිබිය යුතුය.

## IX වෙනි කාණ්ඩය

## ***නියෝග***

***නියෝග***

52. (1) මෙම පනතෙහි ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීමේ හෝ ඉෂ්ට කිරීමේ කාර්යය සඳහා නියෝග පැනවීමට ඇමතිවරයාට පිළිවන.

(2) (1) වෙනි උපවගන්තියෙන් පවරන ලද බලයන්හි සාමාන්‍යත්වයට හානියක් නොවන පරද්දෙන් විශේෂයෙන්ම පහත දැක්වෙන සියලුම කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් යමක් සම්බන්ධයෙන් හෝ නියෝග පැනවීමට ඇමතිවරයාට පිළිවන.එම කරුණු නම්

(අ) මෙම පනතින් නියම කිරීමට ප්‍රකාශිත වූ හෝ සඳහන් කරන ලද වුවමනා වූ සෑම කරුණු

(ආ)මෙම පනතෙහි කාර්යයන් සඳහා තැබිය යුතු පොත් ලේඛන පොත් සහ ඒවායේ ආකෘති පත්‍ර

(ඇ)වෘත්තීය සමිති සහ වෘත්තීය සමිති වල ව්‍යවස්ථා ලියාපදිංචි කල යුතු ක්‍රමය හා ලියාපදිංචි කිරීමේදී ගෙවිය යුතු ගාස්තු

(ඈ)ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති වල හෝ එබඳු වෘත්තීය සමිති වර්ගයක හෝ ගණුදෙනු පරීක්ෂා කරන්නවුන්ගේ සුදුසුකම් හා එය කළ යුතු ක්‍රමය

(ඉ)ලේකම් තැන භාරයේ තබන ලද ලේඛන පරීක්ෂා කිරීමට ඉඩ හරිනු ලබන්නේ කවර නියමයන්ට යටත්වද යන්න සහ එබඳු පරීක්ෂණයකදී අය කල යුතු ගාස්තු

(ඊ)වෘත්තීය සමිතියක අරමුදල් සහ මුදල් නිසි ආකාරයට යෙදීම සහ ප්‍රවේශම් සහිතව තබා ගැනීම

(උ)ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති වල ශුභසාධක අරමුදල් ඇති කිරීම ඒවා පාලනය ආරක්ෂාව හා යෙදීම සහ එයට සම්බන්ධ වූ නැතහොත් අදාල වූ සියලු කරුණු සහ

(ඌ)සාමාන්‍යයෙන් මෙම වගන්තියෙහි විශේෂයෙන් සඳහන් වූ කරුණුවලට හෝ දේවල් වලට අදාල වූ හෝ සම්බන්ධ වූ සියලු කරුණුද වේ.

(3)(2) වෙනි උපවගන්තියෙහි (උ) ඡේදය යටතේ සාදන ලද යම්කිසි නියෝගයක් අදාල වන්නේ විශේෂයෙන් සඳහන් කරන ලද වෘත්තීය සමිතියකට පමණක් බව හෝ එම උපවගන්තියෙහි ඉහත කී ඡේදය යටතේ සාදන ලද නියෝගයක බලපැවැත්වීමෙන් යම්කිසි වෘත්තීය සමිතියක් හෝ වෘත්තීය

සමිති වර්ගයක් නිදහස් වන බව හෝ නියෝගයකින් ප්‍රකාශ කිරීමට ඇමතිවරයාට පිළිවන.

නියෝග අනුමත කිරීම

53. (1) 52 වෙනි වගන්තිය යටතේ සාදන ලද කිසිම නියෝගයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන තෙක් වලංගු නොවන්නේය.එම අනුමැතිය දක්වන දැන්වීම ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතුය.

(2) ඇමතිවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම (1) වෙනි උපවගන්තියෙහි සඳහන් කරන ලද පරිදි එම නියෝගයෙහි අනුමැතිය දක්වන දැන්වීම ප්‍රසිද්ධ කිරීමෙන් පසු මෙහි පනවන ලද්දක් සේ ම වලංගුව ක්‍රියාකාරී බවට පත් වන්නේය.

X වෙනි කාණ්ඩය

*වැරදි සහ දඬුවම්*

*ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක මුදල් හෝ දේපල වැරදි ලෙස පාවිච්චි කිරීම ගැන දඬුවම*

54. (1) ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සාමාජිකයෙකුගේ පැමිණිල්ලක් අනුව එම සමිතියෙහි නිලධාරියෙකු හෝ සාමාජිකයෙකු සමිතියෙහි ව්‍යවස්ථා ප්‍රකාර හැර ඔහු භාරයේ හෝ පාලනයේ යම්කිසි සමිතියේ දේපලක් තබා තිබෙන බව හෝ යම්කිසි සමිතියේ මුදලක් නීති විරෝධී ලෙස වියදම් කොට හෝ ඔහු ලග නවත්වා ගෙන හෝ තිබෙන බව හෝ මහේස්ත්‍රාත් කෙනෙකුට ඒත්තු ගිය විට අවස්ථාවේ හැටියට සාධාරණ යයි හැගී ගියහොත් ඒ සියලු දේපල සමිතියේ භාරකරුවන්ට භාර දෙන ලෙසටත් එසේම නීති විරෝධී ලෙස වියදම් කොට නැතහොත් ලග නවත්වාගෙන තිබුණු මුදල් ඔවුන්ට ගෙවන ලෙසටත් මහේස්ත්‍රාත් තැන විසින් ඒ නිලධාරියාට හෝ සාමාජිකයාට නියම කල යුතුය.

(2) පැමිණිලිකාරයා එම පැමිණිල්ල කල දිනයෙහි පැමිණිල්ල කිරීමට හේතුවූ දේපල අයිති වෘත්තීය සමිතියෙහි සාමාජිකයෙකු බව මහේස්ත්‍රාත් තැනට සෑහෙන පරිදි ඒත්තු නොගිය විටක (1) වෙනි උපවගන්තිය යටතේ කරන ලද පැමිණිල්ලක් පිළිගනු නොලැබේ.

(3) (1) වෙනි උපවගන්තිය යටතේ කරන ලද ආඥාවකින් බැඳුණු යමෙක් එහි නියම සහ දැක්වෙන විධානද එහි සඳහන් කර තිබෙන කාලය තුලදී ඉෂ්ඨ නොකොට පැහැර හරින ලද නම් ඔහු වරදකට වරදකාරයෙක් වන්නේය.මහේස්ත්‍රාත් වරයෙකු විසින් කරන ලද නඩු විසඳීමකින් පසුව වැරදිකාරයා කිරීමේදී රුපියල් පන්සියයකට වැඩිනොවන දඩයකටද ඔහු යටත් වන්නේය.

(4) එබදු නිලධාරියෙකුට හෝ සාමාජිකයෙකුට විරුද්ධව අපරාධ හෝ සිවිල් නඩුවක් පැවරීමට (1) වෙනි උපවගන්තිය යටතේ කරන ලද ආඥාවකින් බාධාවක් නොවන්නේය.

*වෘත්තය සමිති සම්බන්ධව අසත්‍ය තොරතුරු සැපයීම*

55.ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක සාමාජිකයෙකුට හෝ සාමාජිකත්වය බලාපොරොත්තු වන හෝ ඉල්ලුම් කරන කෙනෙකුට හෝ වෘත්තීය සමිතියක ව්‍යවස්ථාවන්හි පිටපතක් යයිද නැතහොත් එහි කරන ලද වෙනස් කිරීම්වල පිටපතක් යයිද හගවමින් යම්කිසි ලේඛණයතක් එය එවකට බලපවත්නා ව්‍යවස්ථාවල හෝ වෙනස්කිරීම්වල නිවැරදි පිටපතක් නොවන බව දැන දැනම යමෙකු රවටන අදහසින් සපයන කිසිවෙක් වරදකට වරදකාරයා වන්නේය.තවද මහේස්ත්‍රාත් කෙනෙකු විසින් කරන ලද නඩු විසඳීමකින් පසු වැරදිකාරයා කිරීමේදී රුපියල් සියයකට වැඩිනොවන දඩයකටද තුන් මාසයකට වැඩි නොවන කාලයකටද යන දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමටද නැතහොත් දඩයකට සහ බන්ධනාගාර ග ත කිරීමකටද යන දඬුවම් දෙකටමද යටත් වන්නේය.එසේම එබදු අදහසකින් ලියාපදිංචි නොකරන ලද වෘත්තීය සමිතියක ව්‍යවස්ථාවන්හි පිටපතක් යයි හගවමින් යම් කිසිවෙකුට වෙනත් ව්‍යවස්ථා පිටපතක් සපයන කෙනෙක්ද කලින් කී ප්‍රකාරම වරදකට වරදකාරයා වී ඉහත කී දඬුවම්වලට යටත් වන්නේය.

*මෙම පනතෙහි වාර්තා ආදිය සම්බන්ධයෙන් ව*

56. ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියක් මෙම පනතින් හෝ මෙම පනත යටතේ සාදන ලද නියෝගයකින් හෝ නියම කරන ලද යම්කිසි ක්‍රියාවක් නොකර හැරියහොත් නැතහොත් දියයුතු දැන්වීමක් නොදී සිටියහොත් හෝ යැවිය යුතු ප්‍රකාශයක් වාර්තාවක් හෝ වෙනත් ලේඛණයක් නොයවා සිටියහොත් එම ක්‍රියාව කිරීමට හෝ එම දැන්වීම දීමට හෝ එම ප්‍රකාශය වාර්තාව හෝ ලේඛනය යැවීමට හෝ වෘත්තීය සමිතියෙහි ව්‍යවස්ථාවලින් හෝ මෙම පනතෙහි විධිවිධාන යටතේ හෝ එය යටතේ කරන ලද නියෝගවලින් හෝ බැඳී සිටින නිලධාරියා හෝ වෙනත් අයෙක් ද එසේ නිලධාරියකු හෝ වෙනත් අයෙකු නොමැති විටක එම සමිතියේ සෑම කාරක සභිකයෙක්ම වෙන් වෙන්වද වරදකට වරදකාරයා වන්නේය.මහේස්ත්‍රාත් කෙනෙකු විසින් කරන ලද නඩු විසඳීමකින් පසුව වැරදිකාරයා කිරීමේදී එබන්දෙක් රුපියල් පනහකට වැඩිනොවන දඩයකටද යටත් වන්නේය.

සාමාන්‍ය දඬුවම

57.(1)මෙම පනතෙහි විධිවිධාන හෝ ඒවා යටතේ සාදන ලද නියෝග හෝ කඩකරන සෑම වෘත්තීය සමිතියක් හා සෑම අයෙක්ද වරදකට වරදකාරයෝ වන්නේය.තවද මහේස්ත්‍රාත් කෙනෙකුගේ නඩු විසඳීමකින් පසු වැරදිකාරයින් කිරීමේදී රුපියල් සියයකට වැඩනොවන දඩයකට හෝ මෙම පනතින් ඒ වරදට නියම කරන ලද වෙනත් දඬුවමකට හෝ යටත් වන්නෝය.

(2) (1) වෙනි උපවගන්තිය යටතේ ලියාපදිංචි නොකරන ලද වෘත්තීය සමිතියක් වැරදිකාරයා වීමෙහිදී මෙම පනත ක්‍රියාවෙහි යෙදවීමෙන් පසු ඕනැම කාලයකදී එම වෘත්තීය සමිතියෙහි කාරක සභිකයින් බවට ඔප්පු වූ සෑම අයෙක්ම වෘත්තීය සමිතිය වරදකාරයා වූ වරදට වෙන් වෙන්ව වරදකාරයන් වූ ලෙසට සලකනු ලැබේ.තවද මහේස්ත්‍රාත් තැන විසින් අවශ්‍ය අන්දමේ විභාග කිරීමකින් පසු තමාගේ තීන්දුවෙහි එසේ වරදකාරයන් වූ සියල්ලන්ගේම නම් සඳහන් කොට නීතියට අනුකූල වූ දණ්ඩනයක් ද ඔවුන් හට නියම කල යුතුය.

නඩු පැවරීම සීමා කිරීම

58.ඇටර්නි ජැනරාල් තැන විසින්ම හෝ ඔහුගේ නියමය පිට නැතහොත් ඔහුගේ කැමැත්ත ලියවිල්ලකින් ලබාගෙන හෝ මිස මෙම පනත යටතේ කිසි නඩුවක් නොපැවරිය යුතුය.

වෙනත් ලිපිගත නීතියක් යටතේ වූ වැරදි අත්හැරීම

59.මෙම පනතෙහි පැහැදිලි ලෙස විස්තර කරන ලද හා සඳහන් කරන ලද වැරදි හා දඬුවම් වෙනත් ලිපිගත නීතියක විස්තර කරන ලද හා සඳහන් කරන ලද වැරදි හා දඬුවම්වලට අතිරේඛව මිස ඒවා වෙනුවට යොදන වැරදි හෝ දඬුවම් නොවේ.

## XI වෙනි කාණ්ඩය

## *විවිධ කරුණු*

සමහර ගිවිසුම්වලට පනතින් හානියක් නොවන බව

60.මෙම පනතින් පහත දැක්වෙන ගිවිසුම්වලට හානියක් නොවන්නේය.

(අ) හවුල්කාරයින් අතර ඔවුන්ගේ වෙළඳ ව්‍යාපාරය පිළිබඳ ගිවිසුමක්

(ආ) සේවා යොජකයෙකු සහ එම සේවයෙහි යොදන ලද අය අතර එම සේවය පිළිබඳ ගිවිසුමක් හෝ

(ඇ) වෙළඳ ව්‍යාපාරයක වෙළඳ නාමයක් විකුණන අදහසින් හෝ වෘත්තියක් හෝ කර්මාන්තයක් හෝ හස්ත කර්මාන්තයක් හෝ උගන්වන අදහසින් හෝ වන ගිවිසුමක්ද වේ.

සමහර පනත් වෘත්තීය සමිති වලට අදාල නොවන බව

61.මෙහි පහත දැක්වෙන පනත් කිසිම වෘත්තීය සමිතියකට අදාල නොවන්නේය.එම පනත් යටතේ යම්කිසි වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීමද නිෂ්ප්‍රභ වන්නේය. එනම්

(අ) වෙළඳ සමාගම් පනත

(ආ) සමිති පනත

(ඇ) වෙළඳ නම් පනත, සහ

(ඇ) සමූපකාර සමිති පනත ද වේ.

*.න්‍යායානුකූල කැඳවීම් නියෝග ආදියභාර කරවීම*

62.සිවිල් හෝ අපරාධ නඩු විභාගයකදී වෘත්තීය සමිතියකට භාරදිය යුතු සෑම සිතාසියක් හෝ දැන්වීමක් හෝ වෙනත් ලේඛනයක් එම වෘත්තීය සමිතියෙහි ලියාපදිංචි කරන ලද කාර්යාලයට හෝ පුද්ගලිකව සභාපති තැනට හෝ භාණ්ඩාගාරික තැනට හෝ ලේකම් තැනට හෝ එම වෘත්තීය සමිතියේ වෙනත් නිලධාරියෙකුට හෝ භාරදීම නිසිපරිදි භාරදීමක් ලෙස සලකනු ලැබේ. නුමුත් එසේ වන්නේ එම භාර දීම ලිපිගත නීතියෙහි නියමයන්ට එකග නම් පමණෙකි.

*38 වෙනි වගන්තිය*

## පළමුවෙනි උපලේඛනය

### සෑම වෘත්තීය සමිතියකම ව්‍යවස්ථාවන්හිම පහත සඳහන් කරුණු සඳහා ඉඩ සැලැස්විය යුතු ය

1. වෘත්තීය සමිතියෙහි නාමය සහ වෘත්තීය සමිතියෙහි කාර්යයන් සඳහා රුස්වීම් පවත්වන ස්ථානය.

2.වෘත්තීය සමිතිය පිහිටුවීමේ සියලු පරමාර්ථ එහි අරමුදල් යෙදිය යුතු කාර්යය සාමාජිකයෙකුට එයින් වන ප්‍රයෝජනයක් ලබාගත හැක්කේ කුමන අන්දමටද යන්න එහි සාමාජිකයෙකුට ගෙවීමට නියම කල හැකි දඩ මුදල් හා අහිමි වන ලෙස නියම කළ හැකි මුදල් ප්‍රමාණය

3.ව්‍යවස්ථා සෑදිය යුතු වෙනස් කල යුතු සංශෝධනය කළ යුතු සහ අවලංගු කළ යුතු ක්‍රමය.

4.වෘත්තීය සමිතියක කාරක සභිකවරුන් ද භාරකාරවරුන්ද ලේකම්වරුන්ද භාණ්ඩාගාරිකවරුන් සහ වෙනත් නිලධාරින් පත් කිරීම තෝරා ගැනීම සහ පහ කිරීම.

5.වෘත්තීය සමිතියහි අරමුදල් ප්‍රවේශම් කර තබා ගැනීම සහ යෙදවීම.එයට වගකිව යුතු නිලධාරියාගේ හෝ නිලධාරින්ගේ ධූර නාමය සහ එහි ගනුදෙනු අවුරුදු පතා හෝ අන් කාලසීමාවක දී පරික්ෂා කිරීම.

6.වෘත්තීය සමිතියෙහි අරමුදල්වල අයිතිවාසිකමක් ඇති කෙනෙකු විසින් වෘත්තීය සමිතියෙහි පොත් සහ සාමාජික නාම ලේඛනය පරීක්ෂා කර බැලීම.

7. වෘත්තීය සමිතිය විසුරුවා හැරීමේ ක්‍රකමය සහ එසේ විසුරුවා හරින අවස්ථාවෙහි ඇතිව තිබුණ අරමුදල් යෙදීම ද වේ.

## දෙවෙනි උපලේඛනය

### I වෙනි ආකෘතිය

### දේශපාලන අරමුදලට ආධාර කිරීමේ දැන්වීමේ ආකෘතිය

### දේශපාලන අරමුදලට ආධාර කිරීමේ දැන්වීම

වෘත්තීය සමිතියේ නාමය :.......................................

……………………………………………වන මම ඉහත සඳහන් වෘත්තීය සමිතියෙහි දේශපාලන අරමුදලට ආධාර කිරීමට කැමැති බව සහ එකග වන බව මෙයින් දැනුම් දෙමි.තවද එනිසා එම අරමුදලට ආධාර කිරීමට මං බැඳී සිටින බවද අස්කර ගැනීමේ දැන්වීමක් ලියා සමිතියේ කාර්යාලයට භාරදෙන තෙක් එසේ ගෙවීමට බැඳී සිටින බවද දනිමි.

(අත්සන් කලේ ) ඒ.බී.

ලියුම් ලැබෙන පිළිවෙල :

භාරදුන් දිනය: …………………………………....

සාමාජික අංකයක් වෙතොත් ඒ අංකය: ……………

### II වෙනි ආකෘතිය

### දේශපාලන අරමුදලට ආධාර කිරීමේ දැන්වීම අස්කර ගැනීමේ ආකෘතිය

### දේශපාලන අරමුදලට ආධාර කිරීම අස්කර ගැනීමේ දැන්වීම

වෘත්තීය සමිතියේ නාමය :.......................................

……………………………………………වන මම ඉහත කී වෘත්තීය සමිතියෙහි දේශපාලන අරමුදලට ආධාර කිරීමට කැමැත්ත දක්වමින් එම සමිතියේ කාර්යාලයට භාරදුන් දේශපාලන අරමුදලට ආධාර කිරීමේ දැන්වීම අස්කර ගන්නා බව මෙයින් දැනුම් දෙමි.තවද මම නැවතත් ආධාර කිරීමේ දැන්වීමක් එම සමිතියේ ලියාපදිංචි කරන ලද කාර්යාලයට භාරදුනහොත් මිස මෙම දැන්වීම සමිතියේ ලියාපදිංචි කරන ලද කාර්යාලයට භාරදුන් දින සිට සමිතියේ දේශපාලන අරමුදලට ආධාර කිරීමට බැඳී නැති බව දනිමි.

(අත්සන් කලේ ) ඒ.බී.

ලියුම් ලැබෙන පිළිවෙල :

භාරදුන් දිනය: …………………………………....

සාමාජික අංකයක් වෙතොත් ඒ අංකය: ……………

සටහන්